**1. දැක්ම**

1. **දැක්ම පිළිබඳ ප්‍රකාශය**

දැක්ම
පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේහි දැක්ම වන්නේ පුරා විද්‍යාවෙන් සහ එහි ශාඛා වලින් සහ සම්බන්ධිත විෂයන්ගෙන් ජාත්‍යන්තරව තරඟකාරී විශේෂඥයන් සහ අදාළ ක්ෂේත්‍රයේ විද්වතුන් සකස් කරනු ලබන උසස් අධ්‍යයනයේ කලාපීය ආයතනයක් වීමය.

**2. මෙහෙවර ප්‍රකාශය**

**මෙහෙවර**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙවර වන්නේ විශේෂඥයන්ට සහ උනන්දුවක් දක්වන මහජනතාවට අධ්‍යාපනික, බුද්ධිමය, ආර්ථිකමය සහ සමාජමය වරප්‍රසාද බෙදාහරිනු ලබන පුරාවිද්‍යාවේ සහ සම්බන්ධිත විෂයන්ගේ ඉදිරිපත් කිරීම, භාවිතයට ගැනීම සහ සන්නිවේදනය කිරීමයි.

**හරය**

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සමූහක්ෂමතාව මගින් මග පෙන්වනු ලබන පුරාවිද්‍යාවේ සහ සම්බන්ධිත විෂයන්ගේ බහුශ්‍රැතභාවයේ, නවෝත්පාදනයේ සහ සමාජමය වගකිවයුතුභාවයේ විශිෂ්ඨත්වය පෝෂණය කරයි.

**මුඛ්‍ය අරමුණ**

ඉහළම මට්ටමේ පර්යේෂණවල නියැලීමේ හැකියාව ඇති සහ පුරාවිද්‍යාවේ සහ සම්බන්ධිත විෂයන්ගේ දැනුම සහ වෘත්තීය ප්‍රමිතියේ ප්‍රගමනයට අර්ථාන්විතව දායක විය හැකි තරඟකාරී විශේෂඥයන් පුහුණු කිරීමට සහ එමෙන්ම එම දැනුම උනන්දුවක් දක්වන මහ ජනතාවට සුලබ කිරීමට.

3. **අධ්‍යක්ෂකවරයාගේ කාර්ය සමාලෝචනය**

අ. සංක්ෂිප්ත හැඳින්වීම

කැලණිය විශ්ව විද්‍යාලයානුබද්ධ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIAR) පුරාවිද්‍යාව හා තදශ්‍රිත විෂය පිළිබඳ විශේෂඥභාවය ලබනු රිසි ශාස්ත්‍රාභිලාෂීන් හා උද්‍යෝගිමත් මහජනතාව උදෙසා ශික්ෂණය, අධ්‍යයනය හා පර්යේෂණය ගැප් කොට ගත් පරිසරයක් සකස් කොට දීම මගින් පුරාවිද්‍යාව සහ තදශ්‍රිත විෂය දැනුම වර්ධනය කිරීමේ, ව්‍යාප්ත කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ස්වකීය ව්‍යවස්ථාගත මෙහෙවර ඉටු කරයි. තවද සංස්කෘතීන්ගේ ත්වරිත ගෝලීයකරණ යුගයක් තුළ සමාජයක සමාජීය හා ආර්ථික වර්ධනය ඇති කිරීමේදී සහ බිහිකිරීමේදී ඉතිහාසය, සංස්කෘතිය, උරුමය, කලාව සහ සාම්ප්‍රදායික ඥාන පද්ධතිය විෂයයෙහි වූ දැනුම ජීව පූර්ණ කාර්යභාරයක් ඉටු කරන බව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය තරයේ විශ්වාස කරයි.

04 ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

| ආයතනය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පශ්චාත් උපාධිය - --පුරාවිද්‍යාව | 44 | 10 | 24 |
| | පශ්චාත් උපාධිය - කෞතුකාගාර විද්‍යාව | 09 | -- | -- |
| | විද්‍යාපති | 46 | - | -- |
| | ශාස්ත්‍රපති | 04 | - | -- |
| | දර්ශනපති | 06 | - | -- |
| | දර්ශනසූරි | 04 | - | -- |
| | ශාස්ත්‍රපති පුරාවිද්‍යාව | 02 | - | -- |
| | ශාස්ත්‍රපති උරුම කළමනාකරණය | 02 | - | -- |
| එකතුව | | 117 | 10 | 24 |

5. දේශීය ශිෂයයන් පිළිබඳ විස්තරය

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් වූ සංඛ්‍යාව | ප්‍රථම වසරේ ශිෂ්‍යයෝ | දෙවන වසරේ ශිෂ්‍යයෝ | තුන්වන වසරේ ශිෂ්‍යයෝ | හතරවන වසරේ ශිෂ්‍යයෝ | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පශ්චාත් උපාධිය - --පුරාවිද්‍යාව | සිංහල/ ඉංග්‍රීසි | 44 | 44 | - | - | - | 28 |
| | පශ්චාත් උපාධිය - කෞතුකාගාර විද්‍යාව | | 09 | 09 | - | - | - | - |
| | උරුම පශ්චාත් උපාධිය | | - | - | - | - | - | 07 |
| | විද්‍යාපති | | 46 | 46 | 65 | - | - | 10 |
| | ශාස්ත්‍රපති | | 04 | 04 | 04 | - | - | - |
| | දර්ශනපති | | 06 | 06 | 13 | - | - | 03 |
| | දර්ශනසූරි | | 04 | 04 | 06 | 07 | - | 03 |
| | ශාස්ත්‍රපති පුරාවිද්‍යාව | | 02 | 02 | - | - | - | - |
| | ශාස්ත්‍රපති උරුම කළමනාකරණය | | 02 | 02 | - | - | - | - |
| එකතුව | | | 117 | 117 | 88 | 07 | - | 51 |

**6. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර**

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය හෝ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | උපදේශක | සහකාර පුස්තකාලයාධිපති |
|---|---|---|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පුරාවිද්‍යාව | සිංහල/ ඉංග්‍රීසි | - | 03 | 05 | 01 | - | - | 01 |
| එකතුව | | - | - | 03 | 05 | 01 | - | - | 01 |

**7. අනධ්‍යයන කාර්යමණ්ඩලයේ විස්තර**

| ආයතනය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය | කනිෂ්ඨ කාර්යමණ්ඩලය | කනිෂ්ඨ සේවක | අධ්‍යයන කාර්යමණ්ඩලය | ලිපිකාර/ශිල්පීය වෙනත් |
|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | - | 03 | 02 | 04 | 02 | 14 |
| එකතුව | - | 03 | 02 | 04 | 02 | 14 |

**8. පර්යේෂණ, නවීකරණ යන ප්‍රකාශන**

| විෂය | ප්‍රකාශන | වෙළඳාමට | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ ගණන | | | 03 |
| නවීකරණ ගණන | නැත | නැත | නැත |
| සඟරා ගණන | | | |
| පොත් ගණන | | | |
| ලිපි ගණන | 16 | | |
| වෙනත් | 03 | | |
| | | | |

**9 පුනරාවර්තන වියදම්**

| විෂය | 2009 රු: | 2010 රු: |
|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 17,737 | 19353 |
| ගමන් වියදම් | 393 | 69 |
| සැපයුම් | 1172 | 1244 |
| නඩත්තු | 734 | 767 |
| කොන්ත්‍රාත්තු සේවා | 5436 | 5252 |
| වෙනත් | 5750 | 6727 |
| ක්ෂය කිරීම් හැර එකතුව | 31,222 | 33,412 |

10. ප්‍රාග්ධන වියදම් විස්තර

| විෂය | 2009 රු: | 2010 රු: |
|---|---|---|
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ ලබා ගැනීම | 1420 | 1256 |
| යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම | | - |
| ගොඩනැගිලි හා ව්‍යුහ ලබා ගැනීම | 172 | 5875 |
| වෙනත් (පුස්තකාල පොත්) | 334 | 462 |
| | | |
| එකතුව | 1926 | 7593 |

11. ව්‍යාපෘති විස්තර (දේශිය/ විදේශිය අරමුදල් )

| නම සහ විස්තර | ණය/ප්‍රදන | අරමුදල් සපයන නියෝජ්‍යාත්වය | TCE Rs. | RFA Rs. | DF Rs. |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | 403750 | | | | |
| | | | | | |
| | 2,347,200 | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

12. ව්‍යාපෘති වියදම් විස්තරය ( දේශීය/ විදේශීය අරමුදල් )

| නම | TCE Rs. | නිමා වන දිනය 2009 | නිමා වන දිනය 2010 | සමුච්චිත වියදම් 31. 12. 2010 | වෙනත් වියදම් % |
|---|---|---|---|---|---|
| | 403750 | - | 124187 | 124187 | |
| | | | | | |
| | 2347200 | - | 1235787 | 1235787 | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| එකතුව | 2750950 | | 1359974 | 1359974 | |

13. මූල්‍ය ප්‍රගතියේ විස්තර ( වියදම්)

| විෂය | ප්‍රාග්ධනය 2010 | වියදම 2010 | ඉතුරුව/ අතිරික්තය |
|---|---|---|---|
| ව්‍යාපෘති ප්‍රාග්ධනය | 33,640 | 33,411 | 229 |
| ව්‍යාපෘති ප්‍රාග්ධනය | 7, 800 | 7, 593 | 207 |
| දේශීය අරමුදල් | 2, 750 | 1,360 | 1390 |
| විදේශීය අරමුදල් | - | | |
| | | | |
| එකතුව | 44190 | 42364 | 1826 |
| එකතුව | | | |

**14. මූල්‍ය ප්‍රාග්ධනය ජනිත කළ ආදායම පිළිබඳ විස්තර**

| ආදායම් මූලාශ්‍රය | 2010 ප්‍රතිපාදන | 2010 එකතුව | හිඟය/අතිරික්තය |
|---|---|---|---|
| a. උපාධි අපේක්ෂක | - | - | - |
| b. පශ්චාත් උපාධි අපේක්ෂක | 1740 | 1781 | S - 41 |
| c. උපදේශකත්වය | - | - | S - 589 |
| d. වෙනත් | 260 | 849 | |
| | | | |
| | | | |
| එකතුව | 2000 | 2630 | S -630 |

# වාර්ෂික වාර්තාව 2010

මහාචාර්ය ජගත් වීරසිංහ

කරන ලද පර්යේෂණ

ගම්පහ ප්‍රදේශයේ බිතුසිතුවම් පිළිබඳ සම්මන්ත්‍රණ සහ ඉදිරිපත් කරන ලද පත්‍රිකා

කැලිෆෝනියා විශ්වවිද්‍යාලයේ බාහිර විද්‍යාර්ථීන් ලෙස සහභාගී වීම

යුරෝපීය අග්නිදිග ආසියානු කලා සහ පුරාවිද්‍යා සම්මේලනයට සහභාගි වීම

මහාචාර්ය රාජ් සෝමදේව

1. ඉගැන්වීම

1.1 ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍ර (පුරාවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය) පැය 36

1.2 ඓතිහාසික තාක්ෂණය (පුරාවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය) පැය 12

1.3 පුරාවිද්‍යා න්‍යායාත්මක ක්‍රම සහ පරිචය (පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව) පැය 36

මුළු ඉගැන්වීම් කාලය 84

2. වාර්තා ලිවීම

2.1 2010 අගෝස්තු මස පළ කිරීමට නියමිත 'උඩවලව ද්‍රෝණියේ පුරාවිද්‍යාව' නම් ශීර්ෂයෙන් යුත් අංක 2 දරන පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනයේ ප්‍රස්තාවික ලිපිය සංග්‍රහ කිරීම.

2.2 ගාල්ලේ සමුද්‍රීය පුරාවිද්‍යාත්මක කෞතුකාගාරය විවෘත කිරීම නිමිත්තෙන් නිකුත් කළ ශාස්ත්‍රීය නිබන්ධනය ජාතික උරුමය සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් සංග්‍රහ කිරීම.

2.3 ජාතික උරුමය සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් ගාල්ලේ සමුද්‍රීය පුරාවිද්‍යාත්මක කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ සූචියක් සම්පාදනය කිරීම.

2.4 ජාතික උරුමය සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් ගාල්ල ලෝක උරුමය මධ්‍යස්ථානයේ කළමනාකරණ සැලැස්ම සම්පාදනය කිරීම.

3. සම්බන්ධීකරණ වැඩකටයුතු

3.1 පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය විසින් ජාතික උරුමය සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සමග එක්ව ක්‍රියාත්මක කරනු ලබන 'ශ්‍රී ලංකාවේ වැදි ජනතාවගේ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම' ව්‍යාපෘතිය සඳහා සම්බන්ධීකාරක ලෙස වර්තමානයේ දී කටයුතු කරනු ලබයි.

3.2 හල්දුම්මුල්ල ඔරු වැළලීමේ ප්‍රදේශය කැණීම.

4. පර්යේෂණ අධීක්ෂණය (වර්තමානය වන විට ක්‍රියාත්මක කරනු ලබන්නා වූ)

4.1 පුරාවිද්‍යා දර්ශනපති උපාධිය 1

4.2 පුරාවිද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය 6

5. උපදේශනය

5.1 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 'ඉතිහාසය' පිළිබඳ වාග් මාලාව සම්පාදනය කිරීමට උපදේශකයෙක් ලෙස කටයුතු කරනු ලැබේ.

5.2 උපදේශක පුරාවිද්‍යාඥ - අනුරාධපුරය දිස්ත්‍රික්කයේ තන්තිරිමලේ කුටීර සොහොන් කැණීමෙහි (2010) කැණීම ඉගැන්වීම.

5.3 යෝජිත රංචමඩම කෞතුකාගාරය සඳහා උපදේශකවරයෙක් ලෙස කටයුතු කිරීම. 2010

6. ප්‍රකාශන

- අන්තර්ජාතික

6.1 සෝමදේව, ආර්. 2010. 2010 අංක 10 දරන ඉන්දීය සාගර පුරාවිද්‍යාව වාර සඟරාවේ පළ වූ උඩවලව ද්‍රෝණියේ පුරාවිද්‍යාව. ''ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ඓතිහාසික සංස්කෘතියේ නව දිගන්තයක්'' දකුණු ආසියානු පුරාවිද්‍යා සමාජයේ 3 වැනි අන්තර්ජාතික කොන්ග්‍රසය, කැළණිය විශ්ව විද්‍යාලය.

- දේශීය

6.2 සෝමදේව, ආර් 2010. වෝකින් ලැඩර්ඃ අ බ්‍රීෆ් සර්වේ ඔන් ද ඩීවලප්මන්ට් ඔෆ් කල්චරල් ක්‍රෝනොලජි ඉන් ශ්‍රී ලංකා. නිමල් ද සිල්වා අභිනන්දන වෙළුම, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මොරටුව විශ්වවිද්‍යාලය. (මුද්‍රණයේ ඇත.)

6.3 සෝමදේව, ආර්. 2010.ට්‍රැවල් ලංකා හි 'කඳුකර ප්‍රභූ පිරිස්'වල අබිරහස විසඳීමේ ගවේෂණය. ශ්‍රී ලංකාවේ සංචාරකයන් සඳහා විස්තීරණ මාසික මාර්ගෝපදේශකය. 2010 මැයි.

6.4 සෝමදේව, ආර්. 2010. ගාල්ලේ සමුද්‍රීය පුරාවිද්‍යා කෞතුකාගාරයඃ දැක්ම. ට්‍රැවල් ලංකා. ශ්‍රී ලංකාවේ සංචාරකයන් සඳහා විස්තීරණ මාසික මාර්ගෝපදේශකය. 2010 ජුනි.

6.5 සෝමදේව, ආර්. 2010. "රත්නපුරය දිස්ත්‍රික්කයේ ගල්පාය, වෙහෙරබින්දයායෙහි ඓතිහාසික පූජා භූමියක කැණීම් කටයුතුඃ සටහනක්". රනාවැල්ල අභිනන්දන වෙළුම, ඉතිහාසය සහ පුරාවිද්‍යාව දෙපාර්තමේන්තුව, රුහුණු විශ්ව විද්‍යාලය.

6.6 සෝමදේව, ආර්. 2010. "ඌව පළාතේ අළුතින් සොයා ගත් පුරාවිද්‍යාත්මක භූමිය". බදුල්ල. (ශාස්ත්‍රීය නිබන්ධනය)

6.7 සෝමදේව, ආර්. 2010. "උඩවලව ද්‍රෝණියේ පුරාවිද්‍යාව". කොළඹ පවත්වන ලද ජාතික පුරාවිද්‍යා සමුළුවේ දී ඉදිරිපත් කරන ලද ලිපියක්.

## ආචාර්ය රෝස් සෝලංගාරච්චි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

පවත්වන ලද පර්යේෂණ:

<u>2010</u>:

"කිරි ඔය ද්‍රෝණියේ පිහිටි ජනාවාසවල ඇති පුරාවිද්‍යාත්මක භූමියේ ධූරාවලිගත පද්ධතිය: පළමු ශත වර්ෂය සහ ක්‍රි.පූ. 10වැනි සියවස අතර කාලපරිච්ඡේදය පිළිබඳව විශේෂ අවධානය ඇතිව."

ප්‍රකාශන:

<u>2010</u>:

(1) ඇ.එ.ජ. ෆ්ලොරිඩා විශ්ව විද්‍යාලය සඳහා සකස් කරන ලද "ඓතිහාසික යකඩ උණු කිරීමේ තාක්ෂණය සහ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පිහිටි කිරි ඔය ද්‍රෝණියේ ජනාවාස රටාව" නම් ආචාර්ය උපාධිය විද්‍යුත් යොමු කිරීම 2011 ජූනි මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. http://purl.fcla.edu/fcla/etd/UFE0041372

ආචාර්ය ටී. ආර්. ප්‍රේමතිලක / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය

1. සාරාංශය

එක්සත් ජනපදයේ ක්වීන්ස් විශ්ව විද්‍යාලයේ (QUB) භූගෝල විද්‍යා, පුරාතන පාරිසරික විද්‍යා සහ පුරා විද්‍යා විද්‍යායතනයේ දී මාගේ පශ්චාත් ආචාර්ය පර්යේෂණ වැඩසටහන අවසන් කළ පසු මම ශ්‍රී ලංකාවේ පශ්චිම චාතුර්ථක දේශගුණ සහ පාරිසරික වෙනස්වීම්වල විස්තරාත්මක පර්යේෂණ වැඩසටහනක් සමග 2009 වර්ෂයේ මැද භාගයේ දී පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත පැමිණියෙමි. මෙම ක්‍රියාවලියෙහි දී ශ්‍රී ලංකාවේ පුරාතන පරිසර විද්‍යාව සහ පුරාවිද්‍යාව යන විෂයයන් සන්දර්භයෙන් අනාගත පර්යේෂණ සැලසුම් / ක්‍රියාකාරකම් සාකච්ඡා කිරීමේ විස්තරාත්මක සාකච්ඡාවක් මා හා පුරා විද්‍යාත්මක විද්‍යා ජර්නලයේ සංස්කාරක මහාචාර්ය වෛද්‍ය සීචී. එච්. හන්ට් (QUB) අතර පැවැත්වුණි. මේ සම්බන්ධයෙන්, මා හට අනෙකුත් අන්තර්ජාතික සහ ජාතික ආයතන ගණනාවක් සමග පර්යේෂණ සහයෝගිතාවය වැඩි දියුණු කිරීමේ අවස්ථාවක් හිමි විය. මෙම පසුබිම සමග මා හට ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ මිහිදන් පුරා විද්‍යාත්මක සහ පුරා පාරිසරික විද්‍යා ගවේෂණය සඳහා නව පර්යේෂණ මෙවලමක් ලෙස, ශාඛ සිලිබා ස්ථර වින්‍යාස වැඩි දියුණු කිරීමට සහ ලද හැකි පුරා පාරිසරික විද්‍යා පර්යේෂණ සමග කටයුතු කිරීමට ඉන්දියාවේ පොන්ඩිචෙරිහි ප්‍රංශ ආයතනයෙහි පර්යේෂණ සහායකයෙකු ලෙස කටයුතු කිරීමට මා හට ආරාධනා ලැබුණි. මෙම වැඩසටහන POLLANDCAL සහ LANDCLIM ඔස්සේ යුරෝපය පුරා විසිරුණු ක්‍රම භාවිතා කරමින් නිවර්තන ප්‍රදේශවල බිම් ආවරණය ප්‍රතිසංස්කරණය, දකුණු ආසියාවේ පුරා පරිසර සංශ්ලේෂණයක් ලබා දීම ද ඉලක්ක කොට ගන්නා ලදී. බොහොමයක් නිවර්තන ප්‍රදේශවල මානව කර්තෘක බිම් ආවරණ ප්‍රතිසංස්කරණය සඳහා අමතර තොරතුරු ලෙස ලබා ගත හැකි අදාළ ඓතිහාසික සහ පුරා විද්‍යාත්මක දත්ත සංශ්ලේෂණයෙහි අඩංගු විය. මෙය අන්තර්ජාතික භූගෝල/ ජෛව ගෝල වැඩසටහන (IGBP) සහ පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය විසින් අනුග්‍රාහකත්වය දක්වන ලද අන්තර් ජාතික පර්යේෂණ වැඩසටහනකි. පසුව ඉක්මණින්ම, එක්සත් රාජධානයේ, බෙල්ෆාස්ට් හි ක්වීන්ස් විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා, පුරා පාරිසරික විද්‍යා සහ පුරාවිද්‍යා විද්‍යායතනයේ දී "ශ්‍රී ලංකාවේ සහල් වගාවේ පුරෝගාමිත්වය සහ විකාසනය අන්වේක්ෂණය කිරීම" යන පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කිරීමට එක්සත් රාජධානියෙහි බ්‍රිතාන්‍ය ඇකඩමිය විසින් මාස හයක කාලයක් සඳහා පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී. මෙම පත් කිරීම විධිමත් හුවමාරු වැඩ සටහනක අංගයක් වූ බැවින් මා අධ්‍යයන ආගන්තුකයෙකුගේ නිර්ණායක සපුරා තිබිණි. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රතිඵල ඉතා සුවිශේෂී වූ අතර, දකුණු සහ ගිනිකොණ දිග ආසියාවේ කෘෂිකාර්මික මූලාරම්භයන්, සංස්කෘතික ජෛව භූගෝල විද්‍යාව සහ පුරා විද්‍යාව කෙරෙහි ඉහළ බලපෑමක් පෙන්වන බව දිස් විය. එබැවින් මෙම ව්‍යාපෘතියෙන් පුරා විද්‍යාත්මක විද්‍යා සඟරාවට සැකසූ ප්‍රකාශනයන් විචාරකයන් ගණනාවකගේ අදහස් දැක්වීම් සහ යෝජනා අනුගමනය කරමින් දැන් ප්‍රතිශෝධනය යටතේ පවතී. අන්තර්ජාතික අවස්ථාවන් ගණනාවකදී, සුවිශේෂී ලෙසම අතීත මානව ප්‍රේරිත පරිසර හා සම්බන්ධ මාගේ දේශගුණ සහ පාරිසරික පර්යේෂණ වැඩ හා ආශ්‍රිත වාචික සහ පොස්ටර් ඉදිරිපත් කිරීම් ඉදිරිපත් කිරීමට මා වෙත ඇරයුම් ලැබිණි. ආචාර්ය ප්‍රේමතිලකගේ මෙම ක්‍රියාවලීන්, පර්යේෂණ අභිරුචි සහ ජයග්‍රහණයන් සඳහා හැඳින්වීමක් පහත පරිච්ඡේද වලින් දැක්වෙයි.

2. අන්තර්ජාතික සහ ජාතික සහයෝගිතාවය යටතේ වර්තමාන පර්යේෂණ / පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යාපනය

නොකඩවා කරගෙන යන ව්‍යාපෘති මාතෘකා :

1. මධ්‍යම ශ්‍රී ලංකාවේ හෝටන් තැන්නේ පශ්චිම චාතුර්ථක (පසුගිය අවුරුදු 25000) පාරිසරික සහ දේශගුණික වෙනස්වීම්

2. ශ්‍රී ලංකාවේ නිම්න භූමි ජීර්ණක ගොහොරුවල හොලොසින (පසුගිය අවුරුදු 10,000) දේශගුණික සහ පාරිසරික වෙනස්වීම්

3. ප්‍රධාන භෝග ශාක හඳුන්වාදීම සමග ශ්‍රී ලංකාවේ අවසන් ඓතිහාසික කාල පරිච්ඡේද තුළ භූ දර්ශන වෙනස්වීම්

4. ශ්‍රී ලංකාවේ යාපහුව, ගල් සොහොන් කනත්ත මහා ශිලා මිහිදන් බිමෙන් රැස් කළ අවසාදිත / පාංශුවල පරාග විද්‍යාත්මක විමර්ශනය

5. පොරුන්තාල් (දකුණු ඉන්දියානු මිහිදන් බිම්) සහ දකුණු ඉන්දියාවේ වැව් බිම් ගණනාවක ඇති ශාක සිලිකාවල (සිලිකාමය ක්ෂුද්‍ර පොසිල) පුරා විද්‍යාත්මක සම්බන්ධය

7. ශ්‍රී ලංකාවේ පශ්චිම ප්ලෙයිස්ටොසීන සහ හොලොසීන ශාක භාවිතය : පාහියන් ගල් ගුහාවේ නික්ෂේපනයන්හි ශාක සිලිකා විමර්ශනය

8. කෙසෙල්වල පෙර මුහුදුබඩ අපහරණය : ශ්‍රී ලංකාවෙන් සාක්ෂි

3. සහයෝගිතා ආයතන : පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIAR), ජාතික පර්යේසණ සභාව (ශ්‍රී ලංකාව) භූගෝල විද්‍යා, පුරා පරිසර විද්‍යා, පුරා විද්‍යා විද්‍යායතනය, ක්වීන්ස් විශ්ව විද්‍යාලය, (එක්සත් රාජධානිය), කිව් උද්‍යානය (එක්සත් රාජධානිය), පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ලුන්ඩ් විශ්ව විද්‍යාලය (ස්වීඩනය), පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය (ඉන්දියාව) පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුව (ශ්‍රී ලංකාව) සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය (ශ්‍රී ලංකාව).

4. ශ්‍රී ලංකාවේ වැඩ බිම් / සංරක්ෂිතඃ හෝටන් තැන්න, නුවරඑළිය, මුතුරාජවෙල (මීගමුව කළපුව) සිරිගම්පොල (වෙන්නප්පුව), ඇස්වත්ත (අවිස්සාවේල්ල), අලුත්වල (හික්කඩුව), සහ පුපුරැස්ස (ගම්පොළ), ෆාහියන් ගල් ගුහාව (බුලත්සිංහල) සහ ගල්සොහොන්කනත්ත (යාපහුව).

5. ඉන්දියාවේ සහ බෝනියෝහි වැඩබිම් /සංරක්ෂිතඃ පොරුන්තාල්, පුලන්කුරුඩි, පරම්බුකන්මා සහ අක්කරම්පතම් (දකුණු ඉන්දියාව), බටහිර සාට් (ඉන්දියාව) සහ ලෝගාන් බර්න්ට්, සරවක්, මැලේසියානු බෝර්නියෝ.

6. **ඉලක්ක / අරමුණු :**

මාගේ වර්තමාන පර්යේෂණයෙහි මූලික ඉලක්ක වනුයේ පශ්චිම චාතුර්ථික දේශගුණික සහ පාරිසරික වෙනස්වීම් (උදා : දිගුකාලීන සහ කෙටිකාලීන දේශගුණික වෙනස්වීම්, ඉහළ කඳුකර සහ පහත්බිම් වැසි වනාන්තරවල ගති ස්වභාව, වැසි වනාන්තර පරිසර කෙරෙහි මානව බලපෑම්, මුහුදු මට්ටම වෙනස්වීමේ බලපෑම ප්‍රතිසංස්කරණය කිරීම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයෙහි 'ගෘහස්ථ සහල්' / සහ අංගයන්ගේ විකාසනයයි. යුරෝපය, නිරිත දිග ආසියාව, ගිනිකොණ දිග ආසියාව සහ ආසියාවෙහි 'පූර්ව නව්‍යශිලා' යනු දඩයම් / පශු මූලික ආර්ථිකයන් (විවිධාකාර යාන්ත්‍රණ ඔස්සේ) ධාන්‍යමය බෝග (තිරිඟු, බාර්ලි, ඕට්ස්, මිලට් සහ සහල්) සහ 'ගෘහස්ථ' සතුන් (ගවයන්, බැටළුවන් / එළුවන්, ඌරන්) සහිත 'ගෘහස්ත වූ' කුඩා පැකේජයන් ගොවිතැන පදනම් කරගත් ආර්ථිකයන් විසින් ප්‍රතිස්ථාපනය වූ විද්වතුන් ගණනාවකගේ ප්‍රශ්න කිරීම් වලට විශාල වශයෙන් ලක් වූ කාලයයි. මෙය වඩාත්ම සිත් ගන්නා ගෝලීය කරුණු වලින් එකක් වන අතර ශ්‍රී ලංකාවේ ඇතැම් වැදගත් පුරා විද්‍යාත්මක සහ පුරා පාරිසරික බිම් වලට (උදා : ෆාහියන් ගල් ගුහාව සහ හෝටන් තැන්න) මානව ඉතිහාසයේ ඉතාම වැදගත් කරුණු අතරින් එකක්

වශයෙන් කෘෂිකර්මාන්තයේ මූලාරම්භයන් පරීක්ෂා කිරීමට විභවයක් ඇතිබව පෙනේ. මෙම අරමුණු සඳහා පුළුල් භූගෝල විද්‍යාත්මක සන්දර්භයක් තුළ පර්යේෂණ ක්‍රියාමාර්ග ගණනාවක ශක්තිමත් දත්ත කුලකයන් ගොඩනැගීම අවශ්‍ය වේ. එබැවින් වර්තමාන පර්යේෂණයෙහි අවසන් අරමුණ වන්නේ ගෝලීය වෙනස්වීම් වැඩ සටහන්වල (උදා : IPPC: දේශගුණික වෙනස්වීම් පිළිබඳ අන්තර් රාජ්‍ය සභාව, PAGES: අතීත ගෝලීය වෙනස්වීම්, INQUA: චාතුර්ථක විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික සංගමය සහ IGBP: අන්තර් ජාතික භූගෝල සහ ජෛවගෝල වැඩසටහන) ඉතාම වැදගත් කරුණු වශයෙන් කලාපීය (දකුණු සහ ගිනිකොණ දිග ආසියාව) දේශගුණික සහ පාරිසරික සහ සම්බන්ධතා වැඩි දියුණු කිරීමයි. ඊට අමතරව, අරමුදලෙහි මැදිහත්වීමකින් තොරව කළ නොහැකි අධ්‍යයනයන් කරගෙන යාමට ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි මට්ටමේ තරුණ ශිෂ්‍යයන් සඳහා අවස්ථාවන් සපයා දීම මගින් ශ්‍රී ලංකාවේ චාතුර්ථක දේශගුණික සහ පාරිසරික වෙනස්වීම වටහා ගැනීමේ ධාරිතාවය ගොඩනැගීම වර්තමාන පර්යේෂණයේ අරමුණයි. වර්තමානයේ දී, පර්යේෂණ ක්‍රියාකාරකම්වලට භූගෝල විද්‍යාව, පුරා පාරිසරික විද්‍යාව, පුරා විද්‍යාව පිළිබඳ විද්‍යායතනය, ක්වීන්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ලුන්ඩ් විශ්ව විද්‍යාලය, ස්වීඩනය, පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුව සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව සහාය දක්වයි. තවද, මම මාගේ පර්යේෂණ ක්‍රියාකාරකම් ස්ථාපිත සහයෝගිතාවය සමග නොකඩවා කරගෙන යාමට සහ පසුගිය වසර 50 දහස පුරා පාරිසරික නියමු සහ පමාවන් සහ INTIMATEgroup/PAGES/INQUA හි කොටසක් ලෙස IFG ශෝධනය කරමින් CELL 50K සමග නව සම්බන්ධතාවයක් ලබාගැනීමට පිවිසීමට බලාපොරොත්තුවෙන් සිටිමි. ව්‍යාපෘතීන්හි ප්‍රධාන කාර්යයන් වනුයේ පුරා පාරිසරික සහ පුරා විද්‍යාත්මක බිම් වෙතින් වන විස්තරාත්මක අධි විභේදන විකිරණශීලී කාබන් දිනැති ලිනෝ සහ ජෛව ස්ථර වින්‍යාස ඉදි කිරීම හා අර්ථ නිරූපණය වේ. මෙම ස්ථර වින්‍යාසනයන්හි නිරාපතිත කාබන්, වැඩි / අඩු සංඛ්‍යාත චුම්බකීය නම්‍යතා, පරාග (පරාග, බීජාණු, dianoflagellate, foraminifera, ඇල්ගී, ක්ෂුද්‍ර අංගාර, තාපමය වැඩීම්, VAM දිලීර, පාසි ක්ෂුද්‍ර පොසිල, සිලිකාමය ක්ෂුද්‍ර පොසිල (ශාක සිලිකා සහ ඩයටම) අඩංගු වේ. මෙම ක්‍රියාවලීන් තුළ පුරා විද්‍යාත්මක සහ පුරා පාරිසරික බිම් වල පරාග සහ ශාක සිලිකා භාවක්ෂය විමර්ශනයද අඩංගු වේ.

7. **පර්යේෂණ උන්නතීන්**

අන්තර්ජාතික ඉහළ බලපෑම් සඟරා ප්‍රකාශනය හන්ට්, සී. ඕ. ප්‍රේමතිලක, ආර් 2010. මැලේසියානු බෝර්නියෝ, සරවක් වෙතින් පූර්ව හොලොසින වෘක්ෂලතා, මානව ක්‍රියාකාරකම් සහ දේශගුණය - චාතුර්ථක ජාත්‍යන්තරය 249, 105 - 119.

8. අන්තර්ජාතික සම්මන්ත්‍රණය, රැස්වීම සහ සාකච්ඡාව: පුරා විද්‍යාවෙහි පරාග විද්‍යාත්මක, සිලිකාමය ක්ෂුද්‍ර පොසිල සහ ශාක ක්ෂුද්‍ර පොසිල අධයනයන්හි භූමිකාව පිළිබඳ පළ කිරීම් සහ පෝස්ටර් සහ වාචික ඉදිරිපත් කිරීම්. POLTRAIN වැඩමුළුවෙහි දී, 2010 දෙසැම්බර් 7-10: පරාග රූප විද්‍යාවේ සිට පුරා පාරිසරික විද්‍යාවට, පරාග විද්‍යාත්මක පර්යේෂණ විද්‍යාගාරයේ ස්වර්ණ ජයන්තිය, පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය, ඉන්දියාව 2010.

9. **පොතෙහි පළ වූ ලිපි**

ප්‍රේමතිලක, ආර් 2010 හෝටන් තැන්න - ලෝක උරුම බිමක් ලෙස සිරිනිමල් ලක්දුසිංහ මයා - අභිනන්දන වෙළුම - 1 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව කැළණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව 1- 12.

ප්‍රේමතිලක, ආර්. 2010. මධ්‍යම ශ්‍රී ලංකාවේ හෝටන් තැන්නේ පරාග විද්‍යාත්මක වාර්තා වලින් අනුමාන කළ හොලොසින පාරිසරික වෙනස්වීම්. මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි - අභිනන්දන වෙළුම I. ඉතිහාසය සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව, 23-33.

10. PAL-LAB, PGIAR සහ QUB හි නොනිමි වැඩ (අඛණ්ඩව කරගෙන යන පර්යේෂණ ක්‍රියාකාරකම්)

හන්ට්, සී. ඕ. සහ ප්‍රේමතිලක, ආර්. 2010 - 2011 , මැලේසියානු බෝර්නියෝ සරවක්හි ලෝගන් බන්ට් වෙතින් පූර්ව හොලොසීන වෘක්ෂලතා සහ දේශගුණ ඉතිහාසය. පුරා පාරිසරික විද්‍යාව, පුරා භූගෝල විද්‍යාව සහ පුරා දේශගුණ විද්‍යාව (විද්‍යාගාර පරීක්ෂණ යටතේ).

හන්ට්, සී. ඕ. සහ ප්‍රේමතිලක ආර්. 2010 - 2011 බෝරනියෝහි පූර්ව හොලොසීන වන සහ වගා කළ සහල්. පුරාවිද්‍යාත්මක සඟරාව (විද්‍යාගාර පරීක්ෂණ යටතේ).

ප්‍රේමතිලක, ආර්, 2010 - 2011 ගිනිකොණ දිග ආසියාවේ මැලේසියානු බෝර්නියෝ වෙතින් වන සහල් ශාක සිලිකා රූප ආකාර (විද්‍යාගාර පරීක්ෂණ යටතේ).

11. බාහිර දේශන

කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයෙහි දේශන (පැය 10) සහ ප්‍රායෝගික පන්ති (පැය 5) ගණනාවක් පැවැත්වීමට මා හට ආරාධනා ලැබී ඇත. මෙම වැඩසටහන ජීව විද්‍යාත්මක විද්‍යාව සහ මානව විද්‍යාව හදාරා ඇති උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් මත පදනම් වේ. **සටහන :** මෙම සියලු ක්‍රියාකාරකම් කිසිදු ගෙවීමක් ලබාගැනීමෙන් තොරව අවසන් කෙරිණි.

12. අනෙකුත් වැඩ සඳහා සහාය

ශ්‍රී ලංකාවේ පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනු ලබන ව්‍යාපෘතියක් සඳහා මාගේ විශේෂඥතාවය ලබා දෙන ලෙස මාගෙන් විමසනු ලැබීය. මෙම ව්‍යාපෘතිය ඓතිහාසික දැව ස්මාරක පිළිබඳ සංවාදයෙහි ඇතැම් පැතිකඩ මත පදනම් විය. මාගේ දායකත්වය වූයේ සංරක්ෂණ අරමුණු සඳහා ක්‍රියාමාර්ග ගැනීමේදී අවශ්‍ය වන බිම් මට්ටමේ වාර්තාවක් සැකසීම සඳහා පාරිසරික දත්ත (දව ස්මාරක හා සම්බන්ධ ආර්ද්‍රතාවය සහ ආලෝක තත්වවල වෙනස්වීම්) එක්රැස් කිරීමේ ක්‍රමවේදාත්මක බල කිරීම· සහ දත්ත කළමනාකරණය සැපයීමය. මෙම ව්‍යාපෘතියෙහි සහකරු වූයේ පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුවේ කුමාරි දිසානායක මහත්මියයි. එක්සත් රාජධානියේ ඔක්ස්ෆෝඩ් විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා සහ පරිසර විද්‍යායතනය විසින් සිදු කළ 'ඉන්දියාවේ බටහිර ඝාට්හි මානව කළමනාකරණය සහ භූ දර්ශන උරුමයන්' ව්‍යාපෘතිය සඳහා මම උපදේශකවරයෙකු වශයෙන් මම ක්‍රියා කළෙමි. හෝටන් තැන්න අපගේ ලෝක උරුමයන්ගෙන් එකක් වශයෙන් නම් කිරීම සඳහා වූ පර්යේෂණ තලයෙහි දී රැස්වීම් සහ සාකච්ඡා ඵලදායීව පැවැත්වීමටද මම මාගේ සේවය ශ්‍රී ලංකාවේ පරිසර අමාත්‍යාංශය වෙත ලබා දුනිමි.

14. **PGIAR හි චර්යානුගත වැඩ**

මම පාරිසරික පුරාවිද්‍යාව සඳහා ප්‍රධාන කථිකාචාර්ය ලෙස කටයුතු කළෙමි. එයට අමතරව PGIAR හි ඩිප්ලෝමා සහ උසස් උපාධි ශිෂ්‍යයන් සඳහා සකස් කළ විභාග වැඩ අධීක්ෂණය කාල සටහන් වලට අනුකූලව නිම කෙරිණි. එක් උසස් උපාධි ශිෂ්‍යයෙකුගේ නිබන්ධනය (විද්‍යාපති) අධීක්ෂණය කළ අතර ඩිපලෝමා ඇගයීම් (35 ක් පමණ) සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මග පෙන්වීම සපයා දෙන ලදී. මම PGIAR හි අධ්‍යයන සහායක වැඩවල යෙදී ඇත. උදා : පශ්චාත් උපාධි මට්ටමේ ශිෂ්‍යයන් හා සම්බන්ධ විෂය නිර්දේශ, භාවිතාවන්, ක්ෂේත්‍ර වැඩ, පාඩම්, විභාග තැඩ යාවත්කාලීන කිරීම. පශ්චාත් උපාධි මට්ටමේ ශිෂ්‍යයන් සඳහා අදාළ අධ්‍යයන වැඩ සිදු කර ඇත. (දේශන, CD සහ වෙනත් ඉදිරිපත් කිරීම් සකස් කිරීම). පාරිසරික පුරාවිද්‍යාව හා සම්බන්ධ කරුණු (උදා: ස්ථර වින්‍යාසාත්මක පැදීම්, ක්ෂේත්‍ර වැඩ, න්‍යෂ්ටි කළමනාකරණය, විද්‍යාගාර වැඩ) වැඩිදියුණු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික වැඩ PGIAR හි දී සම්පූර්ණ කර ඇත. 2011 වර්ෂය සඳහා PGIAR හි තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරන ලෙස මාගෙන් ඉල්ලා ඇත. මවිසින් මාගේ ක්ෂේත්‍ර වැඩ, වර්තමාන පර්යේෂණ සිදු කිරීමට හෝ මාගේ පර්යේෂණ සඳහා සහභාගි වීමට කිසිදු රාජ්‍ය / රජයේ / PGIAR අරමුදලක්

භාවිතා කර නොමැති බව සටහන් කිරීම අවශ්‍ය වේ. නමුත්, සියලු ක්‍රියාකාරකම් ස්ථාපිත කොට ඇති සෘජු / වක්‍ර සහාය සහ සහයෝගිතාවය සමග මනාව කළමනාකරණය කෙරිණි. මවිසින් මාගේ පර්යේෂණ සොයා ගැනීම් / ලිපි වලදී කලාපීය / ගෝලීය පර්යේෂණ ගැටළු වලට අවධානය යොමු කරමින් අන්තර්ජාතික අවස්ථා ගණනාවකදී (උදා : IPPC, PAGES, INQUA, IGBP) සිදු කළද පුරා විද්‍යාත්මක විද්‍යා සඟරාව, චාතුර්ථක ජාත්‍යන්තරය, පුරා පාරිසරික විද්‍යාව, පුරා දේශගුණ විද්‍යාව, පුරා භූගෝල විද්‍යාව (P3) , ග්‍රැනා සහ චාතුර්ථක විද්‍යා සමාලෝචනය ආදී ලොව පුරා විශේෂී සඟරාවල මහත් වර්ධනයෙහි ලැදි බව අනුගමනය කරමින් මම මාගේ රාජකාරි PGIAR වෙත මනාව සිදු කරන ලද බව මාගේ හැඟීමයි.

## ආචාර්ය පී. විදානපතිරණ- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

පාඨමාලා සම්බන්ධීකරණ කටයුතු

මා විසින් පහත දැක්වෙන පාඨමාලාවන් පිළිබඳ වගකීම සහ වෙනත් අදාළ කාර්යභාරයන් භාරගෙන ඇත. පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති සහ විද්‍යාපති උපාධි. කථිකාචාර්යවරු, ඒ ඒ පාඨමාලාවන් සඳහා පාඨමාලා දළ සැලැස්ම සූදානම් කිරීම, කාලසටහන් සකස් කිරීම, කථිකාචාර්යවරුන්ගේ සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පැමිණීම අධීක්ෂණය කිරීම, කථිකාචාර්යවරුන්ගේ ගෙවීම්, ක්ෂේත්‍ර චාරිකා සහ එක් එක් පාඨමාලාව සඳහා වැඩමුළු සූදානම් කිරීම සිදු කරනු ලැබේ.

ඉගැන්වීම- පුරාවිද්‍යාත්මක කැණීම (විද්‍යාපති උපාධිය) ක්ෂේත්‍ර පාසල (2010 දෙසැම්. 16 සිට 5 දක්වා) නිකවුලමුල්ල රුවන්වැල්ලේ දී සහකාර ක්ෂේත්‍ර අධ්‍යක්ෂකවරයෙක් සහ පාඨමාලා සම්බන්ධීකාරකයෙක් සමඟ.

ඓතිහාසික පුරාවිද්‍යාව (ඩිප්ලෝමාව) පැය 10

සංස්කෘතික භූගෝල විද්‍යාව (ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය) පැය 10

බාහිර දේශන - ඓතිහාසික වාරි කර්මාන්තය (පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය, කැළණිය විශ්ව විද්‍යාලය) පැය 15

අධීක්ෂණය - ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ ලිපි 6ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

විද්‍යාවේදී උපාධි නිබන්ධන 6ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

දර්ශනපති උපාධි නිබන්ධන 1ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

පරීක්ෂක - ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ ලිපි 4ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

පර්යේෂණ සහ ප්‍රකාශන

- *"රෝහණ මහාගම: ඓතිහාසික ශ්‍රී ලංකාවේ දක්ෂිණ අධිවේගී මාර්ගය"*, සිරිනිමල් ලක්දුසිංහගේ අභිනන්දන වෙළුම සඳහා, නිපුන ප්‍රකාශන (පෞද්ගලික) සමාගම. ශ්‍රී ලංකාව

- ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත භූගෝලීය සාධක සහ වැව් ව්‍යාප්ති රටාව

  - 2010 රෝහණ මහාගම: ඓතිහාසික ශ්‍රී ලංකාවේ දක්ෂිණ අධිවේගී මාර්ගය, පී. ගුණවර්ධන, ජී. අධිකාරී සහ ආර්. ඒ. ඊ. කොනින්හම් (සංස්කාරකවරු) සිරිනිමල් ලක්දුසිංහ අභිනන්දන වෙළුම, නිපුන ප්‍රකාශන (පෞද්ගලික) සමාගම. ශ්‍රී ලංකාව

- 2010 ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ මුල් කාලීන සහ මධ්‍යකාලීන ඓතිහාසික ජනාවාස, ශ්‍රී ලංකා රෝයල් ආසියාතු සමිතියේ 12 වැනි අන්තර්ජාතික සමුළුවේ දී ඉදිරිපත් කරන ලද ලිපියක්, කොළඹ. මාර්තු 18 සිට 20 දක්වා.

- 2010 ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ මුල් කාලීන සහ මධ්‍යකාලීන ඓතිහාසික ජනාවාස, දකුණු ආසියාතු පුරාවිද්‍යා සමිතියේ 3 වැනි අන්තර්ජාතික කොන්ග්‍රසයේ දී ඉදිරිපත් කරන ලද ලිපියක්, කැළණිය විශ්ව විද්‍යාලය, අගෝස්තු 21 සහ 30වැනි දිනවල.

පර්යේෂණ සහ ප්‍රකාශන

*"රෝහණ මහාගම: ඓතිහාසික ශ්‍රී ලංකාවේ දක්ෂිණ අධිවේගී මාර්ගය",* සිරිනිමල් ලක්දුසිංහගේ අභිනන්දන වෙළුම සඳහා, නිපුන ප්‍රකාශන. 2010.

ප්‍රකාශනය සඳහා සූදානම් ආචාර්ය උපාධි නිබන්ධන

දකුණු පළාතේ ඓතිහාසික භූ ලක්ෂණ, UNDP පර්යේෂණ ප්‍රකාශන, 2010. ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළ තීරයේ මුල් කාලීන සහ මධ්‍යකාලීන ඓතිහාසික වරාය නගර. ආචාර්ය නිමල් ද සිල්වා අභිනන්දන වෙළුම. මොරටුව විශ්ව විද්‍යාලය.

ඉගැන්වීම් - පුරාවිද්‍යාත්මක කැණීම (විද්‍යාපති උපාධිය) ක්ෂේත්‍ර පාසල (2010 දෙසැම්. 5 සිට 16 දක්වා) නිකවුලමුල්ල රුවන්වැල්ලේ දී සහකාර ක්ෂේත්‍ර අධ්‍යක්ෂකවරයෙක් සහ පාඨමාලා සම්බන්ධීකාරකයෙක් සමඟ.

| | |
|---|---|
| ඓතිහාසික පුරාවිද්‍යාව ( ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය ) | පැය 10 |
| ඓතිහාසික තාක්ෂණය (ශාස්ත්‍රපති උපාධිය/විද්‍යාපති උපාධිය) | පැය 15 |
| උරුමය අධ්‍යයනය (ඩිප්ලෝමාව) | පැය 12 |

බාහිර දේශන - වාසස්ථාන පුරාවිද්‍යාව (රුහුණු විශ්ව විද්‍යාලය) පැය 15

අධීක්ෂණය - ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ ලිපි 4ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

විද්‍යාවේදී උපාධි නිබන්ධන 6ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

දර්ශනපති උපාධි නිබන්ධන 1ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

පරීක්ෂක - ශාස්ත්‍රපති උපාධි පර්යේෂණ ලිපි 4ක් (පශ්චාත් උපාධි පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය)

පර්යේෂණ සහ ප්‍රකාශන

*"රෝහනණ මහාගම: ඓතිහාසික ශ්‍රී ලංකාවේ දක්ෂිණ අධිවේගී මාර්ගය",* සිරිනිමල් ලක්දුසිංහගේ අභිනන්දන වෙළුම සඳහා, නිපුන ප්‍රකාශන. 2010.

ප්‍රකාශනය සඳහා සූදානම් ආචාර්ය උපාධි නිබන්ධන

දකුණු පළාතේ ඓතිහාසික භූ ලක්ෂණ, UNDP පර්යේෂණ ප්‍රකාශන, 2010.

ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළ තීරයේ මුල් කාලීන සහ මධ්‍යකාලීන ඓතිහාසික වරාය නගර. ආචාර්ය නිමල් ද සිල්වා අභිනන්දන වෙළුම. මොරටුව විශ්ව විද්‍යාලය.

## රංජිත් බණ්ඩාර මහතා

01) පවත්වන ලද පර්යේෂණ (වර්තමාන පර්යේෂණ)

I. සමාජ තරාතිරම මැනීමේ මූලාරම්භය සඳහා මධ්‍ය යාන් ඔය ද්‍රෝණියේ පුරාවිද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතිය ලෙස සකස් කළ පර්යේෂණ ව්‍යාපෘතිය

II. ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයන කටයුතු සිදු කරයි. මෘතශරීරාගාර පුරාවිද්‍යාව සහ මානවවේද පුරාවිද්‍යාව පිළිබඳව මාගේ ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයනය කරනු ලබයි.

02) සම්මන්ත්‍රණවලට සහභාගිවීම.

''ශ්‍රී ලංකාවේ වියළි කළාපයේ වැව් ආශ්‍රිත ගම්මානවල ජනතාව ගම්මාන අත්හැරයාමේ

හැසිරීම", දකුණු ආසියානු පුරාවිද්‍යා සමිතියේ 3 වැනි අන්තර්ජාතික කොන්ග්‍රසය සඳහා

ඉදිරිපත් කරන ලද ලිපියක්,

03) ප්‍රකාශන

I. ප්‍රකාශන (අන්තර්ජාතික) - 'වැව් ආශ්‍රිත ගම්මානවල ජනතාව ගම්මාන අත්හැරයාමේ හැසිරීම: වැවේ ධාරිතාව කෙරෙහි බලපෑම- ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පිහිටා ඇති ගම්මානයක්", මංගල කටුගම්පොල, තිලක් ගාමිණී ප්‍රියන්ත, අමල්කා විජේසූරිය සහ පූජ්‍ය ඒ. චන්දිම යන අය සමඟ සම-කතෘවරයෙක් ලෙස දකුණු ආසියානු පුරාවිද්‍යා සමිතියේ 3වැනි අන්තර්ජාතික කොන්ග්‍රසයේ සාරාංශ වෙළුමට ඉදිරිපත් කරන ලද ලිපියක්,

ප්‍රකාශන (දේශීය) - (ස්ථානීය අස්ථායීතාව) (තුලනාත්මක උපමිතිය) (සිංහල භාෂාවෙන්) 2010 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පුරාවිද්‍යා සම්මන්ත්‍රණය සඳහා පළ කළ වෙළුම සඳහා ඉදිරිපත් කළ ලිපියක්. (ස්ථානීය අස්ථායීතාව) (තුලනාත්මක උපමිතිය)

4). සම්මන්ත්‍රණවලට සහභාගීවීම.

"වැව් ආශ්‍රිත ගම්මානවල ජනතාව ගම්මාන අත්හැරයාමේ හැසිරීම: වැවේ ධාරිතාව කෙරෙහි බලපෑම- ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ පිහිටා ඇති ගම්මානයක්", දකුණු ආසියානු පුරාවිද්‍යා සමිතියේ 3වැනි අන්තර්ජාතික කොන්ග්‍රසයේ සාරාංශ වෙළුමට ඉදිරිපත් කරන ලද ලිපියක්.

අධ්‍යයන කටයුතුවලින් ඉටු කරන ලද කාර්යයන්

ව්‍යාපෘති වැඩකටයුතු

ක්ෂේත්‍ර සම්බන්ධීකාරක,

රුවන්වැල්ල නිකවැලමුල්ල හු ඔරු සුසානභූමි මුදාගැනීමේ කැණීම් කටයුතු ව්‍යාපෘතිය 2010-

2011, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

ක්ෂේත්‍ර වැඩකටයුතු 2.1

i. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත් වන ලද 2010-2011 නිකවැලමුල්ල හු ඔරු සුසානභූමි මුදාගැනීමේ කැණීම් කටයුතු ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර කටයුතුවල සම-සම්බන්ධීකරකයෙක් ලෙස සහභාගීවිය.

ii. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් රුවන්වැල්ල, නිකවැලමුල්ල පවත් වන ලද 2010 විද්‍යාපති උපාධිය සඳහා වූ ක්ෂේත්‍ර පාසලේ ගුරුවරියක් ලෙස සහභාගීවීම.

ඉගැන්වීම් කටයුතු

- සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ පිඟන් මැටි දෙපාර්තමේන්තුවේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස පත්වීම.
- කැළණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස පත්වීම.

## ඩී. පී. ගමලත් - කථිකාචාර්ය

- ## කරන ලද පර්යේෂණ

1. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත් වන ලද උඩවලව ව්‍යාපෘතිය යටතේ සම්බන්ධිත උඩ රවමදාම පර්යේෂණ කැණීම්වලට සහභාගීවීම.

- ## ඉදිරිපත් කරන ලද සම්මන්ත්‍රණ ලිපි (..... සම්මන්ත්‍රණය/ අධ්‍යයන රැස්වීම)

Comment [n1]: Please refer the English Text and insert the suitable word for this.

1. ශ්‍රී ලංකාවේ ස්වභාෂා ගෘහනිර්මාණ ශිල්පයේ විකාශනය- දකුණු ආසියානු පුරාවිද්‍යා සංගමය, 2010, දකුණු ආසියානු අධ්‍යයන කේන්ද්‍රය, කැළණිය විශ්ව විද්‍යාලය.
2. ජාතික පුරාවිද්‍යාත්මක සම්මන්ත්‍රණයේ දී ඉදිරිපත් කරන ලද සාරාංශය සහ ලිපිය
3. දකුණු ආසියානු පුරාවිද්‍යා සංගමයේ 3වැනි අන්තර්ජාතික කොන්ග්‍රසයේ දී ඉදිරිපත් කරන ලද සාරාංශය සහ ලිපිය, " ශ්‍රී ලංකාවේ ස්වභාෂා ගෘහනිර්මාණ ශිල්පයේ විකාශනය"
4. පරිශිෂ්ඨය V ලිවීම - ඓතිහාසික නිවෙස් බිම්, මහාචාර්ය රාජ් සෝමදේව සමඟ එක්ව - පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, ප්‍රස්තාවික ලිපි අංක 212010

GIS අංශය

1. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වන ලද ව්‍යාපෘති සඳහා පහත දැක්වෙන සිතියම් නිර්මාණය කරන ලදී.

(i) ගාල්ල දිස්ත්‍රික්කයේ 2010 ස්ථාන සහ ස්මාරක ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතියේ පර්යේෂණ සහායකයෙක් ලෙස සහභාගීවීම.

(ii) පහත දක්වෙන සිතියම් නිර්මාණය කරන ලදී.

(1) ගාල්ල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්මාරක ව්‍යාප්තිය, මෙම සිතියමට ස්ථාන 400ක් ඇතුල් කරන ලදී.
(2) ස්ථාන 100ක් ඇතුල්කරමින් ජාතික පුරාවිද්‍යා දත්තසමුදාය යාවත්කාලීන කරන ලදී.

2. පහත දැක්වෙන ඩිජිටල් දත්ත බැංකු සකස් කර තිබේ

(i) ගාල්ල දිස්ත්‍රික්කයේ ස්ථාන සහ ස්මාරක ලියාපදිංචි කිරීමේ දත්ත බැංකුව 2009 - 2010, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

(ii) පුරාවිද්‍යාත්මක කැණීම් වාර්තා සඳහා දත්ත බැංකුව, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, (2010 යාවත්කාලීන කරන ලදී.)
3. පහත දැක්වෙන පෝසටර නිර්මාණය කර තිබේ

(1) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්මාරක ව්‍යාප්තිය (කටයුතු සිදු කරමින් පවතී.)

## පුස්තකාලය - 2010 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා පොත් ප්‍රදානය කිරීම.

| | දින ය | ගිණුම් අංකය | ශීර්ෂය | වටිනාකම | ප්‍රදානය කළ ආයතනය |
|---|---|---|---|---|---|
| 1 | 2.25 | 11838 | ස්වර්ණ ජයන්ති සැමරුම් වෙළුම | 750.00 | කැළණිය විශ්ව විද්‍යාලය |
| 2 | 4.01 | 11843 | ගාල්ල සමුද්‍රීය පුරාවිද්‍යා කෞතුකාගාරය | 500.00 | CCF |
| 3 | 4.01 | 11844 | ජේ. ඩී. ඒ. පෙරේරා ගැලරිය | 500.00 | සෞන්දර්ය හා කලා විශ්ව විද්‍යාලය |
| 4 | 4.23 | 11848 | බෞද්ධ ගන්ධාර ඉතිහාසය | 500.00 | මහාචාර්ය නිමල් ද සිල්වා |
| 5 | 4.23 | 11849 | විල්පත්තු බූව සහ ඊට ඔබ්බෙන් | 500.00 | IUCN |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | 6.15 | 11887 | ක්‍රි. ව. 1506 පෘතුගීසීන් | 400.00 | මහාචාර්ය රෝහණධීර |
| 7 | 6.15 | 11888 | ජෛව විවිධත්වය හා බැඳුනු පාරම්පරික දැනුම | 250.00 | මහාචාර්ය ජී. අදිකාරී |
| 8 | 6.15 | 11947 | ආසියාවේ ස්වදේශ ජනතාව පිළිබඳ අදහස | 1500.00 | සුජීව ජයසිංහ මහතා |
| 9 | 10.14 | 11971 | පාහියන්ගේ බෞද්ධ රාජධානී සහ වන්දනා | 350.00 | මහාචාර්ය නිමල් ද සිල්වා |
| 10 | 10.14 | 11972 | බෞද්ධ සාහිත්‍ය උත්සව හා පාහියන් හිමියන් | 200.00 | මහාචාර්ය නිමල් ද සිල්වා |
| 11 | 10.14 | 11973 | ඉදිකිරීම් සහ හදිසි සැලසුම් | 3500.00 | මහාචාර්ය නිමල් ද සිල්වා |
| 12 | 10.14 | 11974 | සමුද්‍රීය කෞතුකාගාරය | 150.00 | ආචාර්ය අර්ජුන තන්තිලගේ |
| | | | | 9100.00 | |

වාර සඟරා

| දිනය | ගිණුම් අංකය | ශීර්ෂය | වටිනාකම | ප්‍රදානය කළ ආයතනය |
|---|---|---|---|---|
| 1.28 | 3380-3385 | නැෂනල් ජියෝග්‍රෆි | 2500.00 | හෝප් ටොඩ් මහතා |
| 1.28 | 3386 | ලෝරිස් | 300.00 | ආචාර්ය එස්. දැරණියගල |
| 4.01 | 3398-3400 | නැෂනල් ජියෝග්‍රෆි | 1500.00 | හෝප් ටොඩ් මහතා |
| 6.01 | 3404-3409 | සාරථි | 500.00 | සංස්කෘතික දෙපාර්තමේන්තුව |
| 9.06 | 3439-3461 | මානව විද්‍යාව වාර්ෂික සමාලෝචනය | 8000.00 | මහාචාර්ය නිමල් ද සිල්වා |
| 10.14 | 3466 | ලෝරිස් | 300.00 | ආචාර්ය එස්. දැරණියගල |

| | | | | |
|---|---|---|---|---|
| 11.02 | 3471-3474 | නැෂනල් ජියෝග්‍රෆි | 1500.00 | හෝප් ටොඩ් මහතා |
| 12.28 | 3480 | ජේආර්ඒඑස් | 500.00 | නදීකා සංජීවනී මෙනෙවිය |
| | එකතුව | | 15100.00 | |

2010 වසර සඳහා මුළු ප්‍රදානයන් රු. 242000.00 විය.

ප්‍රකාශන විකුණුම් 2010

| ප්‍රකාශනය | 2009 තොග | විකුණුම් | ප්‍රදාන | ඉතිරිය |
|---|---|---|---|---|
| ABIA සූචිය | | | 24 | - |
| ඓතිහාසික කුඹල් කර්මාන්තය පිළිබඳ වට්ටෝරුව | 384 | 30 | 3 | 351 |
| වැඩිදුර අධ්‍යයනයන් | 77 | 10 | 1 | 66 |
| ගල්පාය සමීක්ෂණය | 129 | 10 | 1 | 118 |
| ශ්‍රී ලංකාවේ උරුමය ගොඩනැගීම | | 6 | - | |
| ජනාවාස පුරාවිද්‍යාව | 1273 | 52 | - | 1221 |
| සමුද්‍රීය පුරාවිද්‍යාව | 148 | 7 | 1 | 140 |
| ප්‍රකෘතිකරණය හා සංරක්ෂණය | 390 | 49 | - | 341 |
| රොලන්ඩ් සිල්වා අභිනන්දන වෙළුම | 128 | 8 | 1 | 119 |
| ජනාවාස පුරාවිද්‍යාව | 32 | 1 | - | 31 |
| ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඉතිහාසය | 1076 | 87 | - | 989 |
| ශ්‍රී ලංකාවේ තඹ | - | 13 | - | |
| සාම්ප්‍රදායක ජලශිල්පය | 52 | 21 | - | 31 |
| දකුණු ශ්‍රී ලංකාවේ නාගරික සම්භවය | - | 10 | 10 | |
| භූ දර්ශන සම්ප්‍රදායන් | - | 7 | - | |

වෙනත් පුස්තකාලවලින් කරන ලද ප්‍රකාශන ප්‍රදානයන්

| දිනය | ශීර්ෂය | මිල | පිටපත් | වෙළුම | තැනැත්තන්/ ආයතන |
|---|---|---|---|---|---|
| 2010.03.19<br>2010.02.17 | ඓතිහාසික කුඹල් කර්මාන්තය පිළිබඳ වට්ටෝරුව | 3500.00 | 3 | 10500.00 | 1.මහා. එම්. හෆ්මන්<br>2. මහා. එම්. තකායි<br>3. ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානය |
| 2010.02.17 | රොලන්ඩ් සිල්වා අභිනන්දන වෙළුම | 4000.00 | 1 | 4000.00 | ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානය |
| 2010.02.17 | ගල්පාය සමීක්ෂණය | 1500.00 | 1 | 1500.00 | ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානය |
| 2010.02.07 | වැඩිදුර අධ්‍යයනයන් | 2500.00 | 1 | 2500.00 | ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානය |
| 2010.02.17 | සමුද්‍රීය පුරාවිද්‍යාව | 950.00 | 1 | 950.00 | ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානය |
| 2010.02.17 | ABIA සූචිය | 1500.00 | 24 | 36000.00 | ඉන්දිරා ගාන්ධි ජාතික කලා මධ්‍යස්ථානය<br>විශ්ව විද්‍යාල පුස්තකාල |

එකතුව 55450.00

පුස්තකාල ප්‍රගමන වාර්තාව

1. පොත්- පොත් 172ක් වර්ගීකරණය කිරීම, වට්ටෝරුගත කිරීම සහ එකතුවට එකතු කිරීම කරන ලදී.
2. වාර සඟරා- වාර සඟරා 82ක් මෙම කාල පරිච්ඡේදය තුළ ලැබුනි.
3. පත්‍රිකා- පත්‍රකා 14ක් එකතුවට එකතු කරන ලදී.
4. ප්‍රදානයන් - (ආසන්න වශයෙන්) රු. 24,200/-ක් වටිනා පොත් සහ වාර සඟරා ලැබුනි. (ලැයිස්තුව අමුණා ඇත.)

ABIA දකුණු සහ අග්නිදිග ආසියානු කලා සහ පුරාවිද්‍යා සූචිය 2010

දත්ත ලබා ගැනීම සහ සකස් කිරීම:

දත්ත බැංකුවට සංග්‍රහගත කරන ලද, සංස්කරණය කරන ලද සහ ඇතුල් කරන ලද මුළු වාර්තා සංඛ්‍යාව 219 කි. ප්‍රාග් ඉතිහාසය, මුල් ඉතිහාසය, ඓතිහාසික පුරාවිද්‍යාව, භෞතික සංස්කෘතිය, කලා ඉතිහාසය, නවීන කලාව, ශිලාලේඛණ විද්‍යාව, පුරාක්ෂර විද්‍යාව සහ නාණක ශාස්ත්‍රය යනාදියට සම්බන්ධ තොරතුරු මෙයට ඇතුලත් වේ. වාර්තාවල භූගෝලීය ආවරණපථය දකුණු ආසියාව (ඉන්දියාව සහ ශ්‍රී ලංකාව) සහ අග්නිදිග ආසියාව (තායිලන්තය, මියන්මාරය සහ කාම්බෝජියාව) විය. *abia.lk* අන්තර්ජාල අඩවිය ක්‍රියාත්මක කළ වහාම මෙම වාර්තා අන්තර්ජාලය හරහා මහජන පරිශීලනය සඳහා මුදා හරිනු ලැබේ.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයේ දී ශීර්ෂ පිටු සහ අන්තර්ගත පිටු තැම්පත් කිරීම.

ABIA විසින් ABIA සූචි ☛, ☛☛ සහ ☛☛☛ සඳහා ශීර්ෂ පිටු සහ අන්තර්ගත පිටු ලෙස එක්රැස් කරන ලද ලේඛණ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පුස්තකාලයේ සංරක්ෂිත ලේඛණ ලෙස තැබීම සඳහා භාර දීමේ උත්සවයක් කළමනාකරණ මණ්ඩලයේ/ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දී මාර්තු මාසයේ දී පවත් වන ලදී.

ABIA ශ්‍රී ලංකා සූචිය ☛

2009 වසර තුළ දී එක්රැස්කරන ලද ලේඛණ ආවරණය කරමින් ABIA ශ්‍රී ලංකා සූචිය ☛යේ කෙටුම්පත් අත්පිටපත අන්තර්ජාලයට ප්‍රවේශය නොමැති ශ්‍රී ලාංකික විද්වතුන් සහ ශිෂ්‍යශිෂ්‍යාවන් සඳහා ඇති නිර්දේශන මූලාශ්‍රයක් ලෙස පළ කිරීමට සූදානම් කරන ලදී. මෙයට දකුණු සහ අග්නිදිග ආසියානු කලාව සහ පුරාවිද්‍යාව පිළිබඳ වාර්තා 244ක් ඇතුලත් වේ.

ආචාර්ය ඩබ්ලිව්. එස්. වැලිඅංග

<u>කරන ලද පර්යේෂණ</u>

1.1.වැද්දා ව්‍යාපෘතිය

රතුගලට ක්ෂේත්‍ර චාරිකා පහක් (දින සඳහා 1වැනි වගුව බලන්න.) සිදු කරන ලදී. වැදි ජනතාව සමඟ දින 25ක් පමණ වනාන්තරයේ ගත කළ අතර වැදි ජනතාවගේ සම්පත් උපයෝගීතාව පිළිබඳව තොරතුරු එක්රැස් කරන ලදී. ගල් ගුහා 15ක් පමණ සිතියම්ගත කරන ලදී.

වගුව 1

| වසර | මාසය/ දිනය | ක්ෂේත්‍ර චාරිකාව | ස්ථානය |
|---|---|---|---|
| 2010 | ජුනි 25 – ජුලි 02 | අංක 5 | රතුගල |
| 2010 | ජුලි 27 – අගෝ 02 | අංක 6 | රතුගල |
| 2010 | සැප් 21 – සැප් 27 | අංක 7 | රතුගල |
| 2010 | නොවැ17 – නොවැ 23 | අංක 8 | රතුගල |

1.2.ප්‍රාග්ඓතිහාසික ගල්ගුහාවල විමර්ෂණ විද්‍යාව

ක්ෂේත්‍ර චාරිකා පහක් සිදු කරන ලද අතර ගුහා විමර්ෂණ විද්‍යාව අනුව ගල්ගුහා නමයක් විමර්ෂණය කරන ලදී. (2වැනි වගුව බලන්න.)

වගුව 2

| වසර | මාසය | ක්‍රියාකාරකම |
|---|---|---|
| 2010 | අගෝස්තු | බටදොඹ ලෙන, ෆා හියන් ලෙන, පැල්පොල වවුල් ලෙන, ස්ත්‍රීපුර |
| 2010 | සැප්තැම්බර් | උඳුපියන් ගල්ගේ |
| 2010 | නොවැම්බර් | සීගිරිය පොතන, පිදුරංගල සහ අළු ගල්ගේ |
| 2010 | දෙසැම්බර් | තෙලුල්ල අළු ගල්ගේ කිතුල්ගල බෙලි ලෙන |

1.3.ශ්‍රී ලංකාවේ ගුහා විද්‍යාව

ක්ෂේත්‍ර චාරිකා හතරක් සිදු කරන ලද අතර ගුහා විමර්ෂණ විද්‍යාව අනුව ගල්ගුහා නමයක් විමර්ෂණය කරන ලදී. (2වැනි වගුව බලන්න.)

වගුව 2.

| වර්ෂය | මාසය | ක්‍රියාකාරකම |
|---|---|---|
| 2010 | අගෝස්තු | නෛතර් ගුහාව= වෙඩි ලුණු ගල්ගේ, කඩතැන්න හුනු කෙම, ලියනකබලේ ඇළ ද්විත්ව ලෙන්, තෙල් ලාම්පු ගුහාව, රාවණා ගුහාව= කපු අටුව ගල්ගුහාව |

## 2. සම්මන්ත්‍රණ ලිපි

සම්මන්ත්‍රණවල සහ සම්මේලනවල සම්පූර්ණ ලිපි

1. වැලිඅන්ග ඩබ්ලිවු. එස්., දන්දෙණිය ඒ. එස්., ඇල්ගිරිය පී., දේවගේ ඩී. ඩී., අලහකෝන් ඒ. එම්. ඩී., හෙට්ටිආරච්චි එන්. සහ පී. ජයසිංහ. 2010. ශ්‍රී ලංකාවේ කුරුවිට ස්ත්‍රීපුර ලෙනේ ගුහා විද්‍යා ගවේෂණය. ජාතික පුරාවිද්‍යාත්මක සම්මේලනය 2010. 159-171 පිට.

2. වැලිඅන්ග ඩබ්ලිවු. එස්., මුණසිංහ බී. නලීන් දීපාල්, ගාමිණී අදිකාරී සහ නිමල් ද සිල්වා. 2010. ඇබොරිජනල් පාරිසරික විද්‍යාව: ප්‍රාග්ඓතිහාසික මිනිසා සහ නූතන මිනිසා අතර නැති වූ සම්බන්ධතාව සෙවීම. ජාතික පුරාවිද්‍යාත්මක සම්මේලනය 2010. 193-198 පිට.

3. ප්‍රේමරත්න කේ. එච්. එස්. පී., මැදගෙදර ආර්., ජයවර්ධන එච්. වී. කේ. එන්. දන්දෙණිය, ඒ. එස්. ජයසිංහ පී. සහ ඩබ්ලිවු. එස්. වැලිඅංග. 2010. සාම්ප්‍රදායක ගල් ලෙනක්, හකුරුගල රජ මහා විහාරය ලෙන් ගුහාව, රුවන්වැල්ල, ශ්‍රී ලංකාව. ශ්‍රී ලාංකික අධ්‍යයන පිළිබඳ 12වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය. 2010 මාර්තු 18 සිට 20. කොළඹ. ශ්‍රී ලංකාව. 97 පිට.

4. වැලිඅන්ග ඩබ්ලිවු. එස්. 2010. ප්‍රාග්ඓතිහාසික මසුන් මැරීම, ප්‍රාග්ඓතිහාසික ප්‍රතිසංස්කරණ සඳහා නූතන සාක්ෂි. ශ්‍රී ලාංකික අධ්‍යයන පිළිබඳ 12වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය. 2010 මාර්තු 18 සිට 20. කොළඹ. ශ්‍රී ලංකාව. 98 පිට.

5. දන්දෙණිය ඒ. එස්., දේවගේ ඩී. ඩී., ජයසිංහ පී සහ වැලිඅංග ඩබ්ලිවු. එස්. 2010. ගල්ගුහා සිතියම්ගත කිරීම, ගුහා විද්‍යාවේ ප්‍රධාන පියවරක්. ශ්‍රී ලාංකික අධ්‍යයන පිළිබඳ 12වැනි අන්තර්ජාතික සම්මන්ත්‍රණය. 2010 මාර්තු 18 සිට 20. කොළඹ. ශ්‍රී ලංකාව. 95 පිට.

සාරාංශ

1. වැලිඅංග ඩබ්ලිව්. එස්., දන්දෙණිය ඒ. එස්., ඇල්ගිරිය පී., දේවගේ ඩී. ඩී., අලහකොන් ඒ. එම්. ඩී., හෙට්ටිආරච්චි එන්. සහ පී. ජයසිංහ. 2010. ශ්‍රී ලංකාවේ කුරුවිට ස්ත්‍රීපුර ලෙනේ ගුහා විද්‍යා ගවේෂණය. ජාතික පුරාවිද්‍යාත්මක සම්මේලනය 2010. 159-171 පිට.

2. වැලිඅංග ඩබ්ලිව්. එස්., මුණසිංහ බී. නලීන් දීපාල්, ගාමිණී අදිකාරී සහ නිමල් ද සිල්වා. 2010. ඇබොරිජනල් පාරිසරික විද්‍යාවඃ ප්‍රාග්ඓතිහාසික මිනිසා සහ නූතන මිනිසා අතර නැති වූ සම්බන්ධතාව සෙවීම. ජාතික පුරාවිද්‍යාත්මක සම්මේලනය 2010. 193-198 පිට.

## 3. ප්‍රකාශන

පොත්වල පරිච්ඡේද

1. වැලිඅංග ඩබ්ලිව්. එස්. 2010. Acavus විශේෂවල දේහවලයේ කුහර, පුරාවිද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ පාරිසරික ප්‍රබන්ධයක්. 291-302 පිට. ගුණවර්ධන පී., අදිකාරී ජී. සහ ආර්. ඒ. ඊ. කොනින්හැම් (සංස්කාරකවරු). සිරිනිමල් ලක්දුසිංහ අභිනන්දන වෙළුම. නෙප්චූන් ප්‍රකාශන (පෞද්ගලික) සමාගම. අංක 264/2බී, හීනටිකුඹුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. 443 පිට.

2. වැලිඅංග ඩබ්ලිව්. එස්. 2010. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික මත්ස්‍ය කර්මාන්තය. 211-228 පිට. පෙරේරා පී (සංස්කාරක). මහාචාර්ය එස්. බී. හෙට්ටිආරච්චි මහතාය ගෞරව පිණිස උපහාර ග්‍රන්ථය, පුරාවිද්‍යාව, ඉතිහාසය, බෞද්ධ අධ්‍යයනය සහ මානව විද්‍යාව පිළිබඳ රචනා. සරසවි ප්‍රකාශකයෝ. නුගේගොඩ, ශ්‍රී ලංකාව. 371 පිට.

3. වැලිඅංග ඩබ්ලිව්. එස්. 2010. වැදි ජනතාවගේ පාරිසරික සංස්කෘතිය. මසුන් දඩයම් කිරීමේ කව. 133-139 පිටු. ප්‍රිශාන්ත ගුණවර්ධන සහ ගාමිණී අදිකාරී (සංස්කරණය) - වැදි ජන උරුමය. නෙප්චූන් ප්‍රකාශන. 392 පිටු.

භාර දුන් ලිපි

1. ඔස්බෝන්, ආර්. ඒ. එල්., වැලිඅංග, ඩබ්ලිව්. එස්., ජයසිංහ පද්මකුමාර, දන්දෙණිය, ඒ. එස්., සහ පොග්සන්, ආර්. ඊ., දකුණු සහ මධ්‍යම ශ්‍රී ලංකාවේ proterozoic නයිස් පාශාණ සහ කැම්බ්‍රියන් කළුගල් ගුහාවල ඇති ගුහා සහ කාට්ස් භූ ලක්ෂණ. *Acta Carsologica* වෙත භාර දෙන ලදී.

Comment [n2]: Please refer the English text and insert the suitable word.

2. උපාලි එස්. අමරසිංහ, ජැකෝබ්ස් විජවර්බර්ග්, වසන්ත එස්. වැලිඅංග සහ මැතිජස් වොස්. සර්මකලාපීය මත්ස්‍ය සමාජවල ආහාර ජාල රටාවන් සහ විවිධත්වය. *Lakes and reservoirs* වෙත භාර දෙන ලදී.

<u>ඉදිරිපත් කිරීම් පිළිබඳ අත්පිටපත්</u>

1. වැලිඅංග ඩබ්ලිව්. එස්. ශ්‍රී ලංකාවේ ප්‍රාග්ඓතිහාසික අවධියේ දී ක්ෂීරපායීන් දඩයම් කිරීමේ අවකාශය සහ කාලය.

2. වැලිඅංග ඩබ්ලිව්. එස්., දන්දෙනිය, ඒ. එස්. සහ පී. අල්ගිරිය. අතීතයට ගමනක්, 21වැනි සියවසේ වන්නියෙලැඇත්තෝ (වැද්දා) සමඟ ප්‍රාග්ඓතිහාසික මිනිසා සොයාගන්න.

3. වැලිඅංග ඩබ්ලිව්. එස්., ජයසිංහ පද්මකුමාර, දන්දෙණිය, ඒ. එස්. සහ පී. අල්ගිරිය. ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රාග්ඓතිහාසික ගල්ගුහාවල ගුහා විමර්ෂණ විද්‍යාව.

<u>මහජන මාධ්‍ය</u>

"ද ඩේලි නිවුස්" නම් ජාතික පුවත්පතේ පළ වූ ලිපි.

1. ජර්නි ඉන්ටු ද ඩාක්. 2011 ජන. 24
2. ලයික් ද ෆ්ලෝවින් රිවර්. 2011 පෙබ. 10
3. වැන්ඩලයිසින් ඊස්තටික් බියුටි. 2011 පෙබ. 25.

ඔස්ට්‍රේලියාවේ ළමා සඟරාවක (ටිකිරි) පළ වූ ලිපි.

1. බීස්ට් බීට්ල්ස්. *2010 අප්‍රේල් 15 නිකුතුව.*
2. බර්ඩ්ස්.*2010 ජූනි 16 නිකුතුව.*
3. වැද්දා, ද ඇබොරිජිනල්ස් ඉන් ශ්‍රී ලංකා. *2010 ඔක්තෝබර් 17 නිකුතුව.*
4. ලීෆි ලීව්ස්, භාර දී ඇත.

4. කථා පැවැත්වීම/ දේශන

1.

| දිනය | සංවිධානය කරන ලද ආයතනය | හේතු | කටයුත්ත |
|---|---|---|---|
| 2010.10.18 | බප/පිළි/ධර්මසේන ආටිගල බාලිකා විද්‍යාලය, කැස්බෑව | විද්‍යා දිනය | මිනිසාගේ පරිනාමය පිළිබඳ ඉදිරිපත් කිරීම. |
| 2010.10.19 | ශ්‍රී ජෝන් කොතලාවල විද්‍යාලය, කුරුණෑගල | විද්‍යා දිනය | ජලය පිළිබඳ ඉදිරිපත් කිරීම. |
| 2010.06.11 | මීරිගම බාලදක්ෂ කඳවුරේ පාරිසරික නියමු කඳවුර | 2010 ලෝක පරිසර දිනය | සාම්ප්‍රදායක සංරක්ෂණ පරිචයන්වල කලාව පිළිබඳ ඉදිරිපත් කිරීම. |

| | | | |
|---|---|---|---|
| 2009 අගෝ – 2010 අගෝ | ජන සන්නිවේදනය ශාස්ත්‍රපති උපාධිය | ව්‍යවහාරික සන්නිවේදනය | 10 |
| 2009 අගෝ -2010 අගෝ | පුරාවිද්‍යාව ශාස්ත්‍රපති උපාධිය | ජෛවපුරාවිද්‍යාව | 04 |
| 2010 අගෝ - 2009 සැප් | පාරිසරික ආර්ථික විද්‍යාව ශාස්ත්‍රපති උපාධිය | පාරිසරික ආර්ථික විද්‍යාව | 14 |
| 2009 අප්‍රේල් -2010 අප්‍රේල් | සංස්කෘතිය සහ උරුමය පිළිබඳ ඩිප්ලෝමාව | ජෛවපුරාවිද්‍යාව | 04 |
| 2010 දෙසැ – 2011 දෙසැ | පාරිසරික ආර්ථික විද්‍යාව ශාස්ත්‍රපති උපාධිය | පාරිසරික ආර්ථික විද්‍යාව | 32 |
| 2010 සැප් -2011 සැප් | පුරාවිද්‍යාව ශාස්ත්‍රපති උපාධිය | ජෛවපුරාවිද්‍යාව | 04 |
| 2009/2010 | සංචාරක කර්මාන්තය සහ සංස්කෘතික සම්පත් ශාස්ත්‍රවේදී උපාධිය | ස්වාභාවික සංචාරක කර්මාන්තය | 60 |
| 2009/2010 | අලෙවිකරණය ශාස්ත්‍රවේදී උපාධිය | අන්තර්-පුද්ගල සම්බන්ධතා සංවර්ධනය | 30 |

**පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය**
**(කැළණිය විශ්ව විද්‍යාලය)**
**2010-12-31 දිනට මූල්‍යමය ප්‍රකාශනය**

| | 31.12.2010 | | 31.12.2009 | |
|---|---|---|---|---|
| **<u>වත්කම්</u>** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 406,871,358 | | 409,270,722 | |
| **ආයෝජන** | | | | |
| ස්ථාවර තැන්පතු | 1,198,663 | 408,070,021 | 1,000,000 | 410,270,722 |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය / ගබඩා අත්තිකාරම් | 1,585,372 | | 1,951,808 | |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 123,088 | | 123,088 | |
| කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් | 6,624,289 | | 6,407,291 | |
| මූලධන අත්තිකාරම් | 430,335 | | 488,723 | |
| සේවා සහ සැපයුම් අත්තිකාරම් | 247,430 | | 258,735 | |
| ඉදිරි ගෙවීම් | 132,104 | | 127,294 | |
| වෙනත් ජංගම වත්කම් | 5,323,449 | | 5,323,448 | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 14,205,420 | 28,671,487 | 6,088,687 | 20,769,074 |
| **වත්කම් එකතුව** | | **436,741,508** | | **431,039,796** |
| **<u>වගකීම්</u>** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| විවිධ ණය හිමියෝ | 237,507 | | 5,169,404 | |
| තැන්පත් | 45,981 | | 61,481 | |
| උපචිත වියදම් | 1,389,045 | | 1,022,142 | |
| වෙනත් වගකීම් | 4,639,358 | 6,311,891 | 1,888,650 | 8,141,677 |
| **ජංගම නොවන වගකිම්** | | | | |
| වැය වූ මූලධන | 87,487,604 | | 85,261,579 | |
| වැය නොවූ මූලධන | 3,473,545 | 90,961,149 | 3,266,707 | 88,528,286 |
| විශේෂ අරමුදල් | 352,907,594 | | 352,708,931 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 3,483,755 | | 3,459,555 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 7,155,959 | 363,547,308 | 5,877,427 | 362,045,913 |
| **වගකීම් එකතුව** | | **460,820,348** | | **458,715,876** |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **(24,078,840)** | | **(27,676,080)** |
| ශුද්ධ වත්කම් /හිමිකම පොදු සංචිතය | (24,078,840) | | (27,676,080) | |
| | | (24,078,840) | | (27,676,080) |
| ශුද්ධ වත්කම් / හිමිකම් එකතුව | | **(24,078,840)** | | **(27,676,080)** |

| | | |
|---|---|---|
| **මහාචාර්ය ජගත් විරසිංහ** | **ඩබ්.එල්.වි ජයසේන** | **ඩී.එස්. පි කුමාරසිංහ** |
| අධ්‍යක්ෂ | නියෝජ්‍ය ලේඛකාධිකාරි | නියෝජ්‍ය මුල්‍යාධිකාරි |

**පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය**

**(කැළණිය විශ්ව විද්‍යාලය)**

**2010-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍යමය ක්‍රියාකාරිත්ව ප්‍රකාශනය**

| | 2010 | 2009 |
|---|---|---|
| <u>**මෙහෙයුම් ආදායම්**</u> | | |
| පුනරාවර්ථන ප්‍රතිපාදන | 33,639,960 | 28,636,000 |
| ණය පොළී | 261,547 | 217,792 |
| මිශ්‍ර ආදායම් | 469,075 | 367,482 |
| ලියාපදිංචි ගාස්තු(පශ්චාත් උපාධි) | 266,200 | 78,700 |
| පාඨමාලා ගාස්තු(පශ්චාත් උපාධි) | 1,376,000 | 1,025,350 |
| විභාග ගාස්තු(පශ්චාත් උපාධි) | 139,000 | 58,000 |
| කපා හැරීම් | 5,367,137 | 5,347,786 |
| ප්‍රකාශන අලෙවිය | 80,774 | 108,521 |
| දේපල වලින් ලත් කුළී | 37,846 | 5,000 |
| එකතුව | **41,637,539** | **35,844,631** |
| <u>**මෙහෙයුම් වියදම් (ක්ෂයවීම් ඇතුළුව)**</u> | | |
| වේතන (පරිපාලන හා කාර්යය මණ්ඩල) | 19,352,546 | 17,737,238 |
| ගමන් වියදම් | 69,028 | 393,030 |
| සැපයීම් හා පාරිභෝජන අවශ්‍යතා | 1,244,339 | 1,171,678 |
| නඩත්තු වියදම් | 766,953 | 733,778 |
| ගිවිසුම් ගත සේවා | 5,251,554 | 5,436,364 |
| පර්යේෂණ හා සංවර්ධන | 34,200 | 38,500 |
| ක්ෂය වීම් | 5,387,355 | 5,347,785 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 6,692,905 | 5,711,076 |
| එකතුව | **38,798,880** | **36,569,449** |
| ක්‍රියාකාරි මෙහෙයුම් අතිරික්තය/ඌනතාව | **2,838,659** | **(724,818)** |
| මූල්‍ය පිරිවැය | | |
| දේපල/ උපකරණ අලෙවියෙන් ලත් ආදාය | 758,581 | - |
| අදාල කාලයට ශුද්ධ අතිරික්තය /ඌනතා | **3,597,240** | **(724,818)** |
| පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | (27,676,080) | (26,951,262) |
| අදල වර්ෂයේ අතිරික්තය /ඌනතාවය | 3,597,240 | (724,818) |
| **ඉදිරියට ගෙන ගිය පොදු සංචිතය** | **(24,078,840)** | **(27,676,080)** |

**පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය**
**(කැළණිය විශ්ව විද්‍යාලය)**
**2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2010 | 2009 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් ඌනතාවය /අතිරික්තය | 3,597,240 | (724,818) |
| මුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයන් සඳහා ගැලපීම් | | |
| කපා හැරීම් | (5,367,137) | (5,347,786) |
| ක්ෂය | 5,387,355 | 5,347,786 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 1,278,532 | 737,101 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් ලත් ලාභය | (758,581) | - |
| තොග (වැඩිවීම) /අඩුවීම | 366,436 | (701,319) |
| විවිධ ණය ගැතියෝ (වැඩිවීම) /අඩුවීම | - | 3,835 |
| කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් (වැඩිවීම) /අඩුවීම | (216,998) | (1,498,540) |
| මූලධන අත්තිකාරම් (වැඩිවීම) /අඩුවීම | 82,588 | (2,660,472) |
| සේවා සහ සැපයීම් අත්තිකාරම් (වැඩිවීම) /අඩුවීම | 11,305 | (67,271) |
| ඉදිරි ගෙවීම් (වැඩිවීම) /අඩුවීම | (4,810) | (100,832) |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම) /අඩුවීම | - | (42,451) |
| විවිධ ණය හිමියෝ වැඩිවීම / (අඩුවීම) | (418,949) | 2,479,890 |
| තැන්පත් (වැඩිවීම) /අඩුවීම | (15,500) | (26,750) |
| උපචිත වියදම් (වැඩිවීම) /අඩුවීම | 366,903 | 284,576 |
| වෙනත් වගකීම් වැඩිවීම /(අඩුවීම) | 2,750,708 | (238,682) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 7,059,092 | (2,555,733) |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (7,593,162) | (1,926,858) |
| වාහන අලෙවිය | 850,803 | - |
| ස්ථාවර තැන්පත් | | (1,000,000) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (6,742,359) | (2,926,858) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ප්‍රතිපාදන -පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | 400,000 | 200,000 |
| මූලධන ප්‍රතිපාදන -පුස්තකාල පොත් | 600,000 | 300,000 |
| මූලධන ප්‍රතිපාදන -ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | 1,800,000 | 1,400,000 |
| මූලධන ප්‍රතිපාදන -ස්ථාවර ඉදිකිරීම් | 5,000,000 | - |
| ත්‍යාග සහ පරිත්‍යාග | - | 86,990 |
| ආචාර්ය රෝලන්ඩ් සිල්වා අරමුදල | - | 1,000,000 |
| පර්යේෂණ අරමුදල් | - | - |
| විශේෂ අරමුදල් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 7,800,000 | 2,986,990 |
| මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශුද්ධ වැඩිවීම / අඩුවීම් | 8,116,733 | (2,495,601) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | 6,088,687 | 8,584,288 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | **14,205,420** | **6,088,687** |

## පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## 2010/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් චලනය

| | ප්‍රතිපාදන | පොදු සංචිත | විශේෂ සංචිත | එකතුව |
|---|---|---|---|---|
| **2004/12/31 දිනට ශේෂය** | **36,122,847** | **(19,845,898)** | **6,363,990** | **22,640,939** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 2,900,000 | - | (360,801) | 2,539,199 |
| 2005 වර්ෂයේ ඌනතාවය | - | (925,130) | - | (925,130) |
| **2005/12/31 දිනට ශේෂය** | **39,022,847** | **(20,771,028)** | **6,003,189** | **24,255,008** |
| රජයේ අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 12,518,225 | - | 1,469,941 | 13,988,166 |
| 2006 වර්ෂයේ ඌනතාවය | - | (2,763,546) | - | (2,763,546) |
| **2006/12/31 දිනට ශේෂය** | **51,541,072** | **(23,534,574)** | **7,473,130** | **35,479,628** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 21,300,000 | - | 785,285 | 22,085,285 |
| 2007 වර්ෂයේ ඌනතාවය | - | (196,208) | - | (196,208) |
| **2007/12/31 දිනට ශේෂය** | **72,841,072** | **(23,730,782)** | **8,258,415** | **57,368,705** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 19,135,000 | - | - | 19,135,000 |
| 2008 වර්ෂයේ ඌනතාවය | - | (3,220,480) | 483,878 | (2,736,599) |
| **2008/12/31 දිනට ශේෂය** | **91,976,072** | **(26,951,262)** | **8,742,293** | **73,767,106** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 1,900,000 | - | - | 1,900,000 |
| කපා හැරීම් | (5,347,786) | - | - | (5,347,786) |
| 2009 වර්ෂයේ ඌනතාවය | - | (724,818) | 353,303,621 | 352,578,803 |
| **2009/12/31 දිනට ශේෂය** | **88,528,286** | **(27,676,080)** | **362,045,914** | **422,898,123** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 7,800,000 | - | 1,501,394 | 9,301,394 |
| කපා හැරීම් | (5,367,137) | - | - | (5,367,137) |
| 2010 වර්ෂයේ ඌනතාවය / අතිරික්තය | - | 3,597,240 | - | 3,597,240 |
| **2010/12/31 දිනට ශේෂය** | **90,961,149** | **(24,078,840)** | **363,547,308** | **430,429,620** |

**2010-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව**

| විමසුම් අංකය | විමසුම | ආයතනය විසින් ලබා දී ඇති පිළිතුර | ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග වර්තමාන තත්වය |
|---|---|---|---|
| 1.2.2 | <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u><br><u>ගණකාධිකරණ අඩුපාඩු</u><br>ප්‍රාග්ධන අත්තිකාරම් වශයෙන් ගෙවන ලද පියවා නොතිබූ රු.207,241 ක මුදලින් වැය නොවූ කොටස වැය නොවූ මූලධන වියදම් ලෙස ගිණුම් ගත විය යුතු වුවත් සම්පූර්ණ අත්තිකාරම් මුදලම වැය වූ මූලධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2011 වර්ෂයේ අවසාන ගිණුම පිළියෙල කිරීමේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | නිවැරදි කර ඇත. |
| 1.2.2 | <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br>අ. "වෙනත් ලැබියයුතු ගිණුමෙහි" රු. 123,088 ක ශේෂයන් වර්ෂ 06 කට වැඩි කාලයක් ගතවී ඇතත් නිරවුල් කර නොතිබුණි.<br>ආ. වෙනත් බැරකම් යටතේ අවලංගුකල චෙක්පත් ලෙස දක්වා ඇති ශේෂය තුළ රු. 16,815 ක චෙක්පත් අවලංගු කර වසර 05 කට වැඩි කාලයක් ගතවී ඇතත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.<br>ඇ. රු.214,022 ක් වූ ප්‍රාග්ධන අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිරවුල් කර නොතිබූ අතර එම අත්තිකාරම් තුල රු. 6,713 ක වසර 03 කට වඩා පැරණි අත්තිකාරම් ශේෂයන්ද විය. | අ. අදල නිවැරදි කිරීම් 2011 වර්ෂයේ ගිණුම්වලින් නිවැරදි කිරීමට සටහන් කරගෙන ඇත.<br>ආ. අවලංගුකල චෙක්පත් ලෙස දක්වා ඇති වටිනාකමින් අදවන විට ඉල්ලුම්කර ඇති චෙක්පත්වලට ගෙවීම් කිරීමටත් ඉතිරිය මිශ්‍ර ආදයම් ලෙස ගිණුම්ගත කිරීමටත් කටයුතු කර ඇත.<br>ඇ. මේ වනවිට එම මුදලින් රු.133,197/- අත්තිකාරම් පියවා ඇත. මෙම ප්‍රාග්ධන අත්තිකාරම් පුස්තකාලපොත් සඳහා විදේශිය විදේශිය පොත් සමාගම්වලට ගෙවා ඇති මුදල්ය. පොත් ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. | නිවැරදි කර ඇත.<br>නිවැරදි කර ඇත.<br>ලැබුණු පොත් වෙනුවෙන් වූ අත්තිකාරම් මුදල පියවා ඇත. |
| 1.2.3 | <u>විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම</u><br>සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 09 ක් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. | එම වර්ෂය තුළ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 09හි අවශ්‍ය තොරතුරු විගණනය වෙත ලබාදීමේ යම් ප්‍රමාදයක් තිබුනි. එහෙත් දැනට විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි සකසා ඇත. | |

| | | | |
|---|---|---|---|
| 1.24 | i. නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම<br><br>පහත සඳහන් නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම නිරීක්ෂණය විය.<br><br>**නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව** — **අනුකූල නොවීම**<br><br>(අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br><br>මු.රෙ. 396 — නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ඉකුත් වූ එකතුව රු. 13,088 ක් වූ චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් අදාල පරිදි කටයුතු කර නොතිබුණි.<br><br>(ආ). අංක 09 හා 2006 ජූලි01 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වන පරිච්ඡේදය — ප්‍රවාහන,ආරක්ෂක,පවිත්‍රතා හා වෙනත් ගිවිසුම් ගත සේවා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් රු.737,869ක්,රු.639,078ක්, රු.279,666 ක් හා රු.33,398 ක් වැය කර තිබුණද එම සේවා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | මෙම දුර්වලතාව මගහැරවීම සඳහා මු.රෙ.396ට අනුව ක්‍රියා කිරීමට වහාම පියවර ගන්නා ලදී.<br><br>2011 වර්ෂයේ සිට එම සේවා ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කරන ලදී. | අදාල කටයුතු කර අවසන් කර ඇත.<br><br>ප්‍රසම්පාදන සැලැස්මට අනුව කටයුතු කරගෙන යනු ඇත. |

| | | | |
|---|---|---|---|
| 2.2 | **මෙහෙයුම් සමාලෝචනය** | | |
| 2.2.1 | **අධ්‍යයන කාර්ය සාධනය**<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>අ. සමාලෝචිත වර්ෂය තුළදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 03 ක් ද ශාස්ත්‍රපති පාඨමාලා දෙකක් ද විද්‍යාපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා එක බැගින් ද පැවැත්වීමට සැලසුම් කර තිබුණි.ඊ අනුව පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 03 ක් සඳහා ශිෂ්‍යයින් 56 දෙනෙක් ද විද්‍යාපති පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් 47 දෙනෙක් ද දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා 02 ක් සඳහා පිළිවෙලින් ශිෂ්‍යයින් 03 දෙනෙකු හා 06 දෙනෙකු ද ලියාපදිංචි වී තිබුණි.<br><br>ආ. ඉකුත් වර්ෂයේ පැවැත්වූ ශාස්ත්‍රපති (පුරාවිද්‍යා) හා ශාස්ත්‍රපති (උරුම අධ්‍යයන) පාඨමාලා සඳහා සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යයින් ලියාපදිංචි වී නොතිබුණි.<br><br>ඇ. 2010 වර්ෂයේදී පවත්වන ලද විද්‍යාපති, ශාස්ත්‍රපති, කෞතුකාගාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා උරුම අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා වල අධ්‍යයන ප්‍රතිඵල මෙතෙක් නිකුත් කර නොතිබුණි. | අ.නිවැරදියි<br><br>ආ.නිවැරදියි<br><br>ඇ.මෙම ප්‍රතිඵල නිකුත්කර ඇති අතර, ඉදිරියේදී ප්‍රමාදයන් වැලැක්වීම සඳහා අදාල සැලසුම් සකස් කර ඇත. විභාග මණ්ඩලය රැස්වන දින නිශ්චිතව එහි සඳහන් කර ඇත. වාර්ෂික අධ්‍යයන කැලැන්ඩරය ස්ථාපිත කර ඇත. | ප්‍රතිඵල නිකුත් කර ඇත. ප්‍රමාදයන් වැලැක්වීමට පියවර ගෙන ඇත. |
| 2.2.2 | 3.2.2. **කාර්ය මණ්ඩලය**<br><br>කාර්ය මණ්ඩලයේ සෑම නිලධාරියෙකු හා සේවකයෙකු වෙනුවෙන්ම රාජකාරි පැවරීමක් සිදු කල යුතු වුවත් 32 ක් වූ ආයතනයේ මුළු කාර්ය මණ්ඩලයෙන් 08 දෙනෙකු වෙනුවෙන් රාජකාරි පැවරීම් කර නොතිබුණි. | ආයතනයේ සේවක භවතුන් සියළු දෙනාට රාජකාරි පැවරුම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. | රාජකාරි පැවරුම් ලිපි නිලධාරීන්ට හා සේවකයන්ට ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| 1.2.5 | i. <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු</u><br><br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 1994 ජූනි 14 දින හා අංක 95 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා ගාසා ප්‍රවිතතා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.56,440 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ උපදෙස් පරිදි මෙම ගෙවීම් සිදුකර ඇත. | |
| 2<br>2.1<br>2.1.1 | <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u><br><u>මූල්‍ය සමාලෝචනය</u><br><u>මූල්‍ය ප්‍රතිඵලය</u><br><br>ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.30,801,391 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.29,360,818 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.33,639,960 ක් වූ ප්‍රදානය හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.2,838,659 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 28,636,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂය සඳහා ඌනතාවය රු. 724,818 කට අඩු වී තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| 2.2.3 | **3.2.3. [illegible] ආරක්ෂක සේවය**<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(අ). සේවා ගිවිසුම් අනුව වයස අවු .60 ඉක්මවූ සේවකයන් ආරක්ෂක සේවයේ නොයෙදිය යුතු වුවද අවු .60 ඉක්මවූ සේවකයකු ආරක්ෂක සේවයේ යොදවා තිබුණි.<br><br>(ආ). ආයතන පරිශ්‍රයේ පිහිටීම,ඇති ප්‍රමාණය හා අවශ්‍යතාවය නොසලකා මෙදෙනික පැය අටේ සේවා මුර අත සඳහාම ආරක්ෂක සේවකයින් තිදෙනෙකු බැගින් යොදවා ගෙන තිබූ අතර රාත්‍රී වැඩ මුර ආයතනයේ නිලධාරියකුගේ අධීක්ෂණයට ලක් වී නොතිබුණි.<br><br>3.2.4. පොත් පාඩුව | අ. රාජ්‍ය සේවයේ හොඳ ස්වා පළපුරුද්දක් හා නිපුනත්වයක් ඇති ක්‍රියාකාරි විශ්‍රාමික සේවකයකුගේ සේවය මෙම ආයතනයේ ආරක්ෂක සේවා කටයුතුවදී හොඳ සතුටුදයක තත්වයක් පෙන්නුම්කර ඇති නිසා ඉන් එක් සේවකයකට (ප්‍රධානියකුට) අවුරුදු 65 දක්වා අවස්ථාවදීමට ක්‍රියාකර ඇත.<br><br>ආ) මෙම ප්‍රශ්න සමාලෝචනයට භාජනය කර විගණන හා කළමනාකරණ මණ්ඩල තිරණ පරිදි රාත්‍රී කාලයේ ආරක්ෂ සේවකින් දෙදෙනෙකු පමණක් යෙදවීමට කටයුතු කර ඇත. | දැන් අවුරුදු 60 ඉක්මවූ සේවකයන් . සේවයේ යොදවන්නේ නැත.<br><br>රාත්‍රී කාලයේ දෙදෙනෙකු හා දිවා කාලයේ තිදෙනෙකු බැගින් පැය 12 සේවා මුර දෙක සඳහා ආරක්ෂක සේවයන් යොදවනු ලැබේ. |
| 2.2.4 | පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>අ. වාර්ෂික පොත සමීක්ෂණය අනුව පුස්තකාල පොත් 164 ක හා සඟරා 139 ක ලුහුතාවයක් නිරීක්ෂණය විය. | අ. මෙම පොත් නැතිවීම සිදුවී ඇත්තේ පුස්තකාලයාධිකාරිවරයෙක්ද නොමැති වර්ෂ 25ක කාලයක්දීය. එයින් ද දැනට පොත් සහ සගරා 03 හා 10ක් සොයාගෙන ඇත. ලේඛනගත කිරීමේදී ද්විගණනය වීම නිසා සහ වෙනත් ප්‍රශ්න නිසා ඇත්ත වශයෙන්ම නැතිවීයයි තීරණය කළ හැකි පොත් ප්‍රමාණය 167ට වඩා අඩුවේ. මේ දක්වා ඒවා සොයාගැනීමට ප්‍රයත්න දරමින් සිටි. ඉදිරියේදී මෙම තත්වයන් ඇති නොවීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>(i) ආරක්ෂක නිලධාරියකුගේ පරීක්ෂාව යටතේ බාහිර පාර්ශවයන් පුස්තකාලයට ඇතුල් කිරීම හා පිටකිරීම<br>(ii) පොත් බාහිර පාර්ශවයට ලබාදිම ලේඛනගත කිරීම<br>(iii) ඉදිරියේදී CCTV පුස්තකාලයේ සවිකිරීමට ක්‍රියාකිරීම | දැන් කිසිදු අඩුවක් නොමැතිව පුස්තකාලයේ කටයුතු සිදුවේ. |

| | | | |
|---|---|---|---|
| | ආ. තොග ගැලපුම් ගිණුමෙහි රු. 41,505 ක ශේෂය වර්ෂ 03 කට වැඩිකාලයක් ගතවී ඇතත් නිරවුල් කර නොතිබුණි.<br><br>ඇ. මුද්‍රණය කර වර්ෂ 10 කට වඩා පැරණි අගය රු. 250,508 ක චලනය නොවන තොගයක් ප්‍රකාශන ඇල විය. | ආ. ආයතනයේ ප්‍රකාශනවල මුද්‍රණ වියදම මෙහි දැක්වේ. එම ප්‍රකාශනවලින් යම් කොටස් පුස්තකාලය මාරුකිරීමේදී අස්ථානගත වී ඇති බව සොයාගෙන ඇත. ඒවා තවදුරටත් සොයාගැනීමට කටයුතු කරමින් සිටී.<br><br>ඇ. පුරාවිද්‍යා විෂය සම්බන්ධයෙන් මුද්‍රණය වී ඇති මෙම ප්‍රකාශනයන් වාර්ෂිකව අදාල පාඨමාලාව හදාරන සිසුන් මිලදී ගන්නා බැවින් වේගවත් චලනයක් සිදු නොවේ. | මෙවැනි තත්වයක් ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| 2.2.5 | <u>කොන්ත්‍රාත් පරිපාලනය</u><br><br>පුස්තකාල හා දේශන ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පිළිගෙන කරන ලද රු.මි. 36 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුව 2005 අගෝස්තු 03 දින කැබිනට් මණ්ඩලය අනුමත කර තිබූ අතර වැට් රහිත රු.33,804,507 ක ලංසුවකට 2007 ජනවාරි 19 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුම අනුව 2007 නොවැම්බර් 27 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණද මාස 18 ක කාලයක් තුළදී හතර වතාවක් කාලය දීර්ඝ කිරීම නිසා කාලය වෙනස්වීම හා මිල විචලනය මත ඇස්තමේන්තුවට වඩා රු.4,743,414 කින් පිරිවැය ඉහළ ගොස් තිබුණි.<br><br>මෙම ගොඩනැගිල්ල ගස් කොලන් නොමැති භූමියක ඉදිකිරීමට පලමුව සැලසුම් කර තිබුණද පසුව ගස් කොලන් මැදිකොට ඉදිකිරීම නිසා ගස්වල මුල් හා අතුවල බලපෑම් ඇතිවීමෙන් ගොඩනැගිල්ලේ ඉරිතැලීම් සිදුවී ඇති බව නිරීක්ෂණය විය. තවද මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ අඩුපාඩු කොන්ත්‍රාත්කරු සම්පූර්ණ කර නොතිබූ අතර එම අඩුපාඩු වෙනුවෙන් රු. 82,141 ක් බිල්පත් වලින් අඩුකර ගෙවීම් කර තිබුණද ගොඩනැගිල්ලෙහි අඩුපාඩු මෙතෙක් සම්පූර්ණ කර නොතිබුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර ගස් කොලන් නොමැති භූමියක ඉදිකළ යුතුයැයි සැලසුමක් නොතිබූ අතර වාස්තුවිද්‍යාව පිළිබඳ මහාචාර්ය නිමල් ද සිල්වා මහතාගේ උපදෙස් හා ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ ඉංජිනේරුවරුන්ගේ පරීක්ෂාව යටතේ මෙය ඉදිවී ඇත. ගොඩනැගිල්ලේ එවැනි ඉරිතැලීම් පිළිබඳව පරීක්ෂා කරන ලද ඉංජිනේරුවන් වාර්තා කර නොමැත. පුස්තකාල සහ දේශන ශාලා ගොඩනැගිල්ලේ මුළු වියදම් සඳහා කැබිනට් මණ්ඩලය විසින් රුපියල් මිලියන 36ක් අනුමත කිරීමේදී ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා පමණක් අනුමත ,කර තිබුනේ රු. 23,500,000.00ක් පමණි. නමුත් රේඛිය අමාත්‍යංශය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ටෙන්ඩරය ප්‍රදානය කර තිබුනේ රුපියල් 33,804,569.55කටය.<br><br>එසේ උවත් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා : සත්‍ය වශයෙන්ම වැය වූයේ රු.31,755,611.41ක මුදලකි, කැබිනට් අනුමැතියට අනුව ගොඩනැගිල්ලේ දැව භාණ්ඩ සවිකිරීම, වායුසමීකරණ, උපදේශන සේවා සහ බදු සඳහා අනුමත මුදල් ගෙවූ පසු තවදුරටත් මුදල් ගෙවීමට සිදුවූයේ ඇස්තමේන්තුගත අනුමත මුදලට වඩා වැඩි මුදලකට ටෙන්ඩරය ප්‍රදානය කර තිබූ බැවිනි මෙහිදීමිල වෙනස්වීම් මත වැඩිපුර ගෙවීමට සිදුවූ මුදල රු 204429838 කි<br><br>ගොඩනැගිල්ල ඉදිකිරීමේ කාලය දිර්ඝ කර ඇත්තේ ස්ථානිය ප්‍රශ්න සහ කාලගුණික ප්‍රශ්න හේතුකොට ගෙනයි බෞද්ධාලෝක මාවතට ආරක්ෂක හේතු නිසා බර වාහන ඇතුල් කිරීම සමහර අවස්ථාවල තහනම් කිරීම නිසා ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනයට බාධා ඇතිවීම අදාල කාලය තුල දිර්ඝව ලැබුණු වර්ෂාව නිසා සමහර වැඩ පසුවට කල්දැමීම ආදිය වේ<br><br>පොළවේ මතුපිට සිමෙන්ති බිමේ ඇති ඉරිතැලීම් වෙනුවෙන් මෙම අඩුකිරීම් කර ඇතත් එම කොටස අලුත්වැඩියා කිරීමට යාමේදී මතුවූ ප්‍රායෝගික අපහසුතා නිසා එය අලුත්වැඩියා කිරීම පසුවට කල් දමන ලදී | විගණන විමසුමේ දක්වා ඇති අඩුපාඩුවලට අදාල අලුත්වැඩියාවන් මේ වනවිට නිවැරදි කර ඇත. |

| | | | |
|---|---|---|---|
| 1.2.5 | i. <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු</u><br><br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 1994 ජූනි 14 දින හා අංක 95 දරන චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීණතා දීමනා ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.56,440 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ උපදෙස් පරිදි මෙම ගෙවීම් සිදුකර ඇත. | |
| 2<br>2.1<br>2.1.1 | <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u><br><u>මූල්‍ය සමාලෝචනය</u><br><u>මූල්‍ය ප්‍රතිඵලය</u><br><br>ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.30,801,391 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.29,360,818 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.33,639,960 ක් වූ ප්‍රදානය හේතුකොටගෙන සමාලෝචිත වර්ෂය සඳහා රු.2,838,659 ක අතිරික්තයක් ඇති වී තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 28,636,000 ක ප්‍රදානය හේතු කොට ගෙන එම වර්ෂය සඳහා ඌනතාවය රු. 724,818 කට අඩු වී තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| 2.2.6 | **අරමුදල් ලාභ උපයෝජනය**<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>අ. ප්‍රාග්ධන සහ පුනරාවර්තන කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන බැංකු ජංගම ගිණුම් දෙකෙහි සමාලෝචිත වර්ෂය තුල මාසය අවසානයේ අවම ශේෂයන් පිළිවෙලින් රු.2,808,106 ක් සහ රු.4,019,133 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුල එම ගිණුම් වල ශේෂයන් වල සාමාන්‍ය පිළිවෙලින් රු.5,376,703 ක් හා රු.5,946,359 කවූ බැවින් අරමුදල් උපයෝජනය නොකර ජංගම ගිණුම් වල රඳවා තිබීම නිසා එම මුදල් ආයෝජනය කිරීමෙන් ලබා ගැනීමට තිබූ ප්‍රතිලාභ අහිමි වී තිබුණි.<br><br>ආ. රු.153,508 ක මුදලක් බැංකු ජංගම ගිණුම් අතහා වසර 05 කට වැඩි කාලයක් රඳවා තිබුණි.<br><br>ඇ. සමාලෝචිත වර්ෂය ආරම්භ වන විට රු. 3,191,598ක ශේෂයක් වැය නොවූ මූලධන ගිණුමේ තිබූ අතර වර්ෂය තුල රු. 400,000 ක ප්‍රතිපාදන වෙන්කරවා ගෙන තිබුණි.එසේ වුවද වැයකර තිබුණේ මුදල රු. 890,592 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 2,701,006 ක් එනම් ප්‍රතිපාදනයෙන් 75% ක් ඉතිරිව තිබුණි. | ඇ) ආයෝජනය කිරීමට හැකිකම ඇත්තේ භාණ්ඩාගාර අරමුදල් නොවන බාහිරින් ලැබෙන වෙනත් අරමුදල් පමණක් බැවින් එම අරමුදල් පුනරාවර්තන ගිණුමෙහි අන්තර්ගතව ඇතත් ආයෝජනය කලහැකි තරම් ප්‍රමාණවත් කාලයක් රඳානොපැවතීම ආයෝජනය නොකිරීමට හේතු වී ඇත මූලධන ගිණුමේ ඇත්තේ භාණ්ඩාගාර මුදල්ය එම මුදල් ගෙවීම් කර ඇත<br><br>ආ) මෙම ගිණුම් ක්‍රියාත්මක තත්වයේ නොමැති බැවින් කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් ලබාගෙන වසාදැමීමට සටහන් කරගන්නා ලදී<br><br>ඇ) ආයතනයේ පැවති සේවක දුෂ්කරතාවය හේතුකොටගෙන මෙවැනි තත්වයක් ඇතිවී තිබුනද මෙම අඩුපාඩු මග හරවා ගැනීමට කටයුතු කරනු වස් මෙම අරමුදල් උපයෝජනය කිරීමට කටයුතු සිදුකර ඇත | [illegible] කර අවසන් කර ඇත<br><br>මෙම මුදල් උපයෝජනය කෙරෙමින් පවතී |
| 2.2.7 | **අයවැය ලේඛනමය පාලනය**<br><br>සමාලෝචිත වර්ෂයේ අයවැය ගත හා සත්‍ය ආදායම් වියදම් අතර සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | ආයතනයේ පර්යේෂණ කටයුතු ඉතා බහුලව සිදුකරන බැවින් හදිසියේ මතු වන කැණීම් පර්යේෂණ කටයුතු සඳහා මුදල් වැය කිරීමට සිදුවේ එම අවස්ථාවේදී අභ්‍යන්තර අනෙකුත් වැය ශිර්ෂවලින් ඉතිරි මුදල් අධ්‍යක්ෂතුමාගේ අනුමැතිය මත වැය ශිර්ෂ අතර මාරුකර එම මුදල් උපයෝගී කරගෙන අදාල වියදම් දැරීම සිදුකිරීමට කටයුතු කරන බැවින් ආයතනයේ සඵල අයවැය පාලන කාරකය වශයෙන් අයවැය ලේඛනය උපයෝගී කරනු ලබන අතර ඉදිරි වසරවලදීද එසේ කටයුතු කිරීමට පියවර ගෙන ඇත | මෙම පිලිවෙත දැනට ක්‍රියාත්මක කරමින් පවතී |

| | | | |
|---|---|---|---|
| 3 | **පද්ධති හා පාලන**<br><br>විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට කලින් කලට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.<br><br>(අ) පුස්තකාල<br>(ආ) ව්‍යාපෘති<br>(ඇ) කාර්ය මණ්ඩල<br>(ඈ) ගබඩා පාලනය | මෙම ක්ෂේත්‍රයන්හි පාලන පද්ධති ක්‍රම සඳහා විශේෂ අවධානය යොමුකර ඇත | විගණන විමසුමේ දක්වා ඇති ක්ෂේත්‍රවලට අවධානය යොමුකර ඇත. |